# II. 1962 ආර්ථික හා මූල්‍ය හැඩගැස්ම

## (අ) ජාතික නිෂ්පාදිතය සහ වියදම.

### හැඳින්වීම

1962 දළ ජාතික නිෂ්පාදිතය, පවත්නා සාධක වියදම් මිල අනුව, රුපියල් කෝටි 631·3 කට තාවකාලිකව ඇස්තමේන්තු කොට ඇත. පසුගිය අවුරුදු තුනේ සංශෝධිත ඇස්තමේන්තු අනුව, මෙය 1959 සඳහා රුපියල් කෝටි 583·5 ක් ද, 1960 සඳහා රුපියල් කෝටි 602·0 ක්ද, 1961 සඳහා රුපියල් කෝටි 606·7 ක් ද, යන වශයෙන් ගණන් බලා ඇත. මේ අනුව, 1962 දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය සියයට 4·1 කි. 1960 දී වර්ධනය සියයට 3·2 ක් වූ අතර, 1961 වර්ධනය සියයට 0·8 ක්ව තිබිණි.

1962 දී අර්ථ ක්‍රමයෙහි ක්‍රියා කාරිත්වය පෙරාතු අවුරුදු හා සසඳා බලන විට, සතුටුදායක යයි කිවහැකිය. එහෙත් මෙහිදී සැලකිල්ල යොමු විය යුතු කරුණු කිහිපයකි. 1962 දළ ජාතික නිෂ්පාදිතයේ වැඩි වර්ධනය පිළිබිඹු කරන සංඛ්‍යා ලබාගෙන ඇත්තේ 1961 තරමක් අසතුටු දයක වූ සංඛ්‍යා සමග සැසඳීමෙනි. 1962 දළ ජාතික නිෂ්පාදිතය, 1960 සංඛ්‍යා සමග සැසඳුයේ නම්, දැවුරුදු කාලය තුළ වර්ධනයේ වැඩිවීම් සාමාන්‍යය සියයට 2·4 ක් පමණ බව හෙළිවේ.

1961 දී ප්‍රතිඵල අසතුටුදායක වීමට ප්‍රධානතම හේතුව වූයේ, අපනයන මිල සැලකිය යුතු ලෙස අඩුවී යාමය. පිටරට පැටවීම සඳහා නිපද වූ භාණ්ඩ ප්‍රමාණය සැලකිය යුතු ලෙස වැඩි වුවද, මිල අඩුවීමෙන් ඉන් ලද වාසිය ද මැකී ගියේය. 1962 දී අපනයන භාණ්ඩ නිෂ්පාදනය, පසුගිය වසරට වඩා වැඩි වූයේ ඉතා මඳ වශයෙනි. එහෙත් තරමක් අඩුවූ අපනයන මිල නිසා ඇති වූ අවාසිය, මකාලීමට වැඩියෙනුත් ප්‍රමාණ විය. මේ අනුව මුදලින් මණින කල 1962 දළ ජාතික නිෂ්පාදිතයෙහි දක්නට ලැබෙන ප්‍රමාණවාචක වර්ධනයට, එක් අතකින් හේතුවී ඇත්තේ, අපනයන මිල, අඩු වශයෙන් පහළ වැටීමය.

මූර්ත වශයෙන් මැණීමේ දී ද, 1962 වර්ෂය 1961 ට වඩා තරමක් හොඳ වර්ෂයක් බව පෙනේ. අර්ථ ක්‍රමයේ දේශීය අංශයේ මූර්ත නිපැයුම, 1962 දී සැලකිය යුතු ලෙස වැඩිවිය. 1961 දී වී නිෂ්පාදනයේ ඇති වූ මඳ වැඩිවීම හා සසඳන විට 1962 එය බුසල් කෝටි 0·49 කින් හෙවත් සියයට 11 කින් වැඩි වී ඇත. 1961 දී සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වූ මාලු නිෂ්පාදනය, 1962 දී ද, බොහෝ සෙයින් වැඩිවිය. දේශීය අංශයේ ඉතිරි කොටසේ ද මූර්ත වශයෙන් ඇතිවූ මුළු වැඩිවීම පසුගිය වසරේ ඇති වූ මුළු වැඩිවීමට වඩා සැහෙන ප්‍රමාණයකින් වැඩිය.

1961 දී පිටරට පැටවීම සඳහා කැරුන මුළු නිෂ්පාදනය (ශුද්ධ) සියයට 3·8 කින් අඩු වී ගිය ද, 1962 දී එය සියයට 1·2 කින් වැඩිවිය. දේශීය අංශයෙහි මුළු නිපැයුම, (ශුද්ධ) මුදල් ප්‍රමාණයෙන් මණින කල 1962 දී සියයට 5·0 කින් වැඩිවී ඇත. එහෙත් පසුගිය වසරේ වැඩිවීම සියයට 2·2 ක් පමණෙකි. ඉහත සඳහන් කළ පරිදි මාලු හා වී නිෂ්පාදනයේ වැඩිවීමත් සමගම, රජයේ ව්‍යාපාරවල කාර්මික නිෂ්පාදනය, ප්‍රවාහණය හා පණිවුඩ හුවමාරුව, සහ ප්‍රාග්ධන සංවර්ධනය, මුදල් ප්‍රමාණයෙන් මැණීමේදී බොහෝ සෙයින් වැඩිවී ඇත. 1962 දී දේශීය අංශයේ ඇතිවූ වර්ධනයට මෙයද බොහෝ සෙයින් ඉවහල් විය.

මෑත වර්ෂවලදී ජනගහනය වැඩිවූ ප්‍රමාණය ද ගණන් ගෙන සලකා බලන විට, මුදල් ප්‍රමාණයෙන් බැලුවද ජාතික නිෂ්පාදිතයේ වැඩිවීම, එතරම් සතුටුදායක යැයි කිව හැක්කේ නොවේ. දළ ජාතික නිෂ්පාදිතයෙන් එක් අයකුට වැටෙන ප්‍රමාණය, 1962 දී සියයට 1·3 කින් වැඩිවිය. 1960 දී වැඩිවීම සියයට 0·3 ක් විය. එහෙත් 1961 දී මෙය සියයට 1·9 කින් පහළ වැටිණි.

දළ ජාතික නිෂ්පාදනයේ එක් අයෙකුට වැටෙන ප්‍රමාණය 1962 දී රුපියල් 604 ක් විය. මෙය 1959 දී රුපියල් 606 ක් ද, 1960 දී රුපියල් 608 ක් ද, 1961 දී රුපියල් 597 ක් ද වශයෙන් පැවැති සංඛ්‍යා සමග සැසැඳෙන්නේය. මේ අනුව එක් අයෙකුට වැටෙන දළ ජාතික නිෂ්පාදනය, මුදලින් මණින කල, 1961 දීට වඩා 1962 දී වැඩි වුවද, 1959 හෝ 1960 පැවැති මට්ටමට පැමිණ නැති බව හෙළිවෙයි.

වෙළෙඳ මිල අනුව දළ දේශීය වියදම, 1962 දී රුපියල් කෝටි 679·9 කැයි ඇස්තමේන්තු කොට ඇත. දළ දේශීය වියදමට, පාරිභෝජන වියදම හා දේශීය දළ ප්‍රාග්ධන සම්පාදන වියදම* ගැනෙන අතර, එය දළ ජාතික නිෂ්පාදිතයෙන් වෙන්ව ගණන් බලා ඇත. මෙය 1959, 1960 සහ 1961 සංඛ්‍යාවන රුපියල් කෝටි 655·1 ක් ද රුපියල් කෝටි 673·6 ද, රුපියල් කෝටි 660·9 ද හා සැසැඳෙන්නේය. එක් අයෙකුට වැටෙන ප්‍රමාණය පදනම් කොට බැලීමේදී 1962 සංඛ්‍යාව රුපියල් 651 ක් වී ඇත. මෙය 1961 දී පැවැති සංඛ්‍යාව, වන රුපියල් 650 ට හාත්පසින්ම සමානය. 1959 දී සහ 1960 දී එක් අයෙකුට වැටෙන දළ දේශීය වියදම, රුපියල් 681 ක් වීමෙන් ඉහළ මට්ටමක පැවැතිණි.

### සංඛ්‍යා සටහන II අ—1

## නිෂ්පාදනය හා වියදම පිළිබඳ දර්ශක සාරාංශය—පවත්නා මිල අනුව

| | 1959 | 1960 | 1961 | 1962 |
|---|---|---|---|---|
| (අ) වටිනාකම | | | | |
| 1. ජාතික නිෂ්පාදිතය–දළ–සාධක මිල අනුව (රු. දශ ලක්ෂ) .. | 5,835 | 6,020 | 6,067 | 6,313 |
| 2. දේශීය වියදම–දළ–වෙළෙඳ මිල අනුව (රු. දශ ලක්ෂ) .. | 6,551 | 6,736 | 6,609 | 6,799 |
| 3. පෞද්ගලික පාරිභෝජනය–වෙළෙඳ මිල අනුව (රු. දශ ලක්ෂ) | 4,579 | 4,837 | 4,728 | 4,908 |
| 4. රජයේ පාරිභෝජනය–වෙළෙඳ මිල අනුව (රු. දශ ලක්ෂ) .. | 897 | 963 | 968 | 985 |
| 5. දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය–වෙළෙඳ මිල අනුව (රු. දශ ලක්ෂ) .. .. .. .. .. | 1,033 | 967 | 904 | 985 |
| 6. භාණ්ඩ අපනයනය (1) සහ සාධක නොවන සේවා (රු. දශ ලක්ෂ) .. .. .. .. .. | 2,016 | 2,011 | 1,907 | 1,976 |
| 7. භාණ්ඩ ආනයන (2) සහ සාධක නොවන සේවා (රු. දශ ලක්ෂ) | —2,176 | —2,209 | —1,972 | —2,068 |
| 8. ජාතික නිෂ්පාදිතය–දළ ප්‍රතිශීර්ෂ වශයෙන් (3) සාධක මිල අනුව (රුපියල්) .. .. .. .. .. | 606 | 608 | 597 | 604 |
| 9. දේශීය වියදම–දළ–ප්‍රතිශීර්ෂ වශයෙන් (රුපියල්) .. .. | 681 | 681 | 650 | 651 |
| (ආ) දර්ශක අංක (1959 — 100·0) | | | | |
| 1. ජාතික නිෂ්පාදිතය–දළ–සාධක මිල අනුව .. .. .. | 100·0 | 103·2 | 104·0 | 108·2 |
| 2. දේශීය වියදම–දළ–වෙළෙඳ මිල අනුව .. .. .. | 100·0 | 102·8 | 100·9 | 103·8 |
| 3. පෞද්ගලික පාරිභෝජනය–වෙළෙඳ මිල අනුව .. .. | 100·0 | 105·6 | 103·3 | 107·2 |
| 4. රජයේ පාරිභෝජනය–වෙළෙඳ මිල අනුව .. .. | 100·0 | 107·4 | 107·9 | 109·9 |
| 5. දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය–දළ–වෙළෙඳ මිල අනුව | 100·0 | 93·7 | 87·5 | 95·4 |
| 6. භාණ්ඩ අපනයන (1) සහ සාධක නොවන සේවා .. .. | 100·0 | 99·7 | 94·6 | 98·0 |
| 7. භාණ්ඩ ආනයන (2) සහ සාධක නොවන සේවා .. .. | 100·0 | 101·5 | 90·6 | 95·0 |
| 8. ජාතික නිෂ්පාදිතය–දළ–ප්‍රතිශීර්ෂ වශයෙන් (3) සාධක මිල අනුව | 100·0 | 100·3 | 98·4 | 99·7 |
| 9. දේශීය වියදම–දළ ප්‍රතිශීර්ෂ වශයෙන් .. .. .. | 100·0 | 100·0 | 95·5 | 95·6 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(1) අපනයන කළ වෙළෙඳ භාණ්ඩ—නැ.වි.ස. මිල—වටිනාකම

(2) ආනයන කළ වෙළෙඳ භාණ්ඩ—මි.ර.ගැ.—වටිනාකම

(3) පදනම් කැරුනේ පහත සඳහන් ජනගහන ඇස්තමේන්තුය

| | 1959 | 1960 | 1961 | 1962 |
|---|---|---|---|---|
| මැදි අවුරුදු ජනගහනය .. | 96,25,000 | 98,96,000 | 1,01,67,000 | 1,04,46,000 |
| දර්ශක අංකය .. | 100·0 | 102·8 | 105·6 | 108·5 |

*දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය = දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය සහ තොග වෙනස්වීම්

## සංඛ්‍යා සටහන II අ—2

# ජාතික නිෂ්පාදිතය-දළ-පවත්නා සාධක මිල අනුව

| | රුපියල් දශ ලක්ෂ | | | | වෙනසෙහි සියයට ගණන | | |
|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1959න් 1960 ට | 1960න් 1961 ට | 1961න් 1962 ට |
| 1. අපනයන සඳහා නිෂ්පාදනය | | | | | | | |
| (i) දේශීය අපනයනය: නැ.වි.ස. වටිනාකම | 1,692 | 1,775 | 1,681 | 1,766 | + 4·9 | — 5·3 | + 5·1 |
| තොග වෙනස්වීමේ වටිනාකම .. | ... | — 37 | + 16 | — 38 | | | |
| පාවිච්චි කළ ආනයන භාණ්ඩ හැර (වෙළෙඳ වටිනාකමට) .. .. | —121 | —117 | —129 | —133 | | | |
| අපනයන කැරුන භාණ්ඩ බෙදහැරීමේ වියදම් හැර .. .. .. | —104 | —109 | —114 | —123 | | | |
| නිපැයුම (ශුද්ධ) .. .. .. | 1,46 7 | 1,512 | 1,455 | 1,472 | + 3·0 | — 3·8 | + 1·2 |
| (ii) ප්‍රති අපනයන : එකතු කළ වටිනාකම .. | 3 | 2 | 2 | 2 | —20·0 | — | — |
| අපනයන සඳහා කැරුන මුළු නිෂ්පාදනය : නිපැයුම (ශුද්ධ) .. .. .. | **1,470** | **1,514** | **1,457** | **1,474** | **+ 3·0** | **— 3·8** | **+ 1·2** |
| 2. දේශීය පාවිච්චිය සඳහා නිෂ්පාදනය (නිපැයුම- ශුද්ධ) .. .. .. | | | | | | | |
| (i) කෘෂිකර්මය, දූව ඇ වන ද්‍රව්‍ය, පශු සම්පත හා ධීවර කර්මාන්තය .. .. | 1,279 | 1,342 | 1,380 | 1,430 | + 5·0 | + 2·9 | + 3·6 |
| (ii) කර්මාන්ත-අන්තැනක නොසඳහන්. .. | 255 | 305 | 342 | 406 | +19·3 | +12·1 | +18·9 |
| (iii) ප්‍රාග්ධන සංවර්ධනය (භාණ්ඩ හා සේවා) | | | | | | | |
| (අ) රජය .. .. .. | 220 | 177 | 181 | 186 | —19·6 | + 2·3 | + 2·6 |
| (ආ) රජයේ ව්‍යාපාර .. .. | 45 | 42 | 48 | 86 | — 6·0 | +13·6 | +80·5 |
| (ඇ) පෞද්ගලික අංශය හා රජයේ සමායතන .. .. .. | 249 | 252 | 239 | 209 | + 1·2 | — 5·2 | —12·8 |
| (iv) ප්‍රවාහණය හා පණිවුඩ හුවමාරුව (රජයේ නොවන) .. .. .. | 429 | 454 | 450 | 485 | + 5·8 | — 1·0 | + 7·8 |
| (v) වෙළෙඳාම (රජයේ නොවන) .. .. | 617 | 631 | 601 | 627 | + 2·2 | — 4·7 | + 4·3 |
| (vi) නිවාස අයිතිය .. .. .. | 169 | 178 | 196 | 205 | + 5·9 | + 9·9 | + 4·5 |
| (vii) රජයේ, අන්තැනෙක නොසඳහන් .. | 701 | 724 | 757 | 776 | + 3·3 | + 4·5 | + 2·5 |
| (viii) සේවා, අන්තැනෙක නොසඳහන් .. | 438 | 445 | 457 | 474 | + 1·5 | + 2·8 | + 3·5 |
| එකතුව .. .. .. | **4,402** | **4,550** | **4,651** | **4,883** | **+ 3·4** | **+ 2·2** | **+ 5·0** |
| 3. ජාතික නිෂ්පාදිතය-දළ .. .. .. | **5,872** | **6,064** | **6,107** | **6,356** | **+ 3·3** | **+ 0·7** | **+ 4·1** |
| 4. පිටරටින් ලැබූ සාධක ආදයම (ශුද්ධ) .. | **— 37** | **— 44** | **— 40** | **— 43** | | | |
| 5. ජාතික නිෂ්පාදිත (දළ) .. .. | **5,835** | **6,020** | **6,067** | **6,313** | **+ 3·2** | **+ 0·8** | **+ 4·1** |

### ශීර්ෂ විග්‍රහය

1. රජය යන්නට, ශීර්ෂ 2 (iii) (අ) 2 (vii) මහ ආණ්ඩුව සහ පලාත් පාළන ආණ්ඩු අයත් වෙයි. එහෙත්, රජයේ සමායතන හා රජයේ ව්‍යාපාර (දුම්රිය, විදුලි වැඩ, වරාය කොමිසම, තැපැල් හා තැපැල් පණිවුඩ සහ ලුණු දෙපාර්තමේන්තුව) ඇතුළත් නොවේ.
2. ශීර්ෂ 2 (vii) (රජයේ අන් තැනෙක නොසඳහන්) ට, රජයේ ගොඩනැගිලිවල ආරෝපිත කුලිය ඇතුළත් වෙයි.
3. රාජ්‍ය අංශයේ ශුද්ධ ප්‍රාග්ධන සංවර්ධන නිපැයුමට (ශුද්ධ) (ශීර්ෂ 2 (iii) (අ)) පහත ශීර්ෂ ඇතුළත් වෙයි.
   (අ) කොන්ත්‍රාත් පිට කැරුන රජයේ ප්‍රාග්ධන වැඩවල (ශුද්ධ) නිපැයුම සහ
   (ආ) ප්‍රාග්ධන සංවර්ධනයේදී කරන ලද අවශේෂ සේවා—උද : රජයෙන් ආනයනය කැරුන ප්‍රාග්ධන භාණ්ඩ ප්‍රවාහණය.
4. පෞද්ගලික අංශයේ සහ රජයේ සමායතනවල ප්‍රාග්ධන සංවර්ධනයේ (ශුද්ධ) නිපැයුමට (ශීර්ෂ 2 (iii) (ඇ)) පහත සඳහන් ශීර්ෂ ගැනේ.
   (අ) ගොඩනැගිලි කර්මාන්තවල (ශුද්ධ) නිපැයුම
   (ආ) දේශීය ප්‍රයෝජනය සඳහා ගොඩනැගිලි උපකරණ සහ අනෙකුත් ප්‍රාග්ධන භාණ්ඩ, නිපදවන කර්මාන්තයන් ගේ ශුද්ධ නිපැයුම සහ
   (ඇ) වගාවේ සහ නැවත වගාවේ ශුද්ධ නිපැයුම.
5. ශීර්ෂ 2 (iv) ට (ප්‍රවාහණය සහ පණිවුඩ හුවමාරුව (රජයේ නොවන)) සහ ශීර්ෂ 2 (v) ට (වෙළෙඳාම (රජයේ නොවන)) මේ අංශයේ ක්‍රියාත්මක වන රජයේ ව්‍යාපාර ගැනේ. පසුගිය වසර වලදීමෙන් නොව, අපනයන අංශය සඳහා දරන ලද සේවාවන් ද මේ ශීර්ෂ වලට ඇතුළත් වෙයි.

### පොදු සටහන් :

1. පළකර ඇති සංඛ්‍යා ද, (ලංකා රේගු වාර්තාවෙන්) සමහර නියමිත ශීර්ෂ සඳහා සංඛ්‍යාගත් විශේෂ වාර්තා ද එනම්, කර්මාන්ත හා කර්මාන්ත නිපැයුම් දෙපාර්තමේන්තුව හැර මේ සංඛ්‍යා සටහන ද ජාතික වියදම් ... පිළිබඳ සංඛ්‍යා සටහන ද සාද ගැනීමට අවශ්‍ය වූ මූලික සංඛ්‍යා තොරතුරුවලින් වැඩි කොටසක් සංඛ්‍යා සහ ජනලේඛන දෙපාර්තමේන්තුව විසින් කරුණා පෙරදැරිව සපයා ඇත.
2. සටහන්වල සංඛ්‍යා ළඟම දශමස්ථානයට ගෙනඊම නිසා ශීර්ෂ එකතු හා මුළු එකතු වලින් වෙනස් විය හැකිය.
3. සංඛ්‍යා සටහන්වල වෙනස් වීමේ සියයට ගණන සකසා ඇත්තේ වටිනාකම රු. දශ ලක්ෂ වලින් මුල් දශම ස්ථානයට ගෙන ඊමෙනි.
4. 1961 මහබැංකු වාර්ෂික වාර්තාවේ පළකැරුන 1959 සිට 1961 තෙක් වූ නිෂ්පාදිත හා වියදම් ඇස්තමේන්තු සංශොධනය කොට ඇත. 1962 ඇස්තමේන්තු තාවකාලිකය.

වෙළෙඳ මිල අනුව, 1962 පෞද්ගලික පාරිභෝජනය, රුපියල් කෝටි 490·8 ක් විය. මෙය 1961 සමානුරූප සංඛ්‍යාවට වඩා සියයට 3·8 කින් වැඩි වූ අතර, රජයේ පාරිභෝජනය වෙළෙඳ මිල අනුව, රුපියල් කෝටි 98·5 ක් වීමෙන් සියයට 1·8 කින් වැඩිවිය. දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය, 1962 දී රුපියල් කෝටි 98·5 ක් වීමෙන් 1961 සංඛ්‍යාවට වඩා සැහෙන ලෙස සියයට 9·0 කින් වැඩිවී ඇත. එහෙත් 1962 සංඛ්‍යාව 1959 සංඛ්‍යාව වූ රුපියල් කෝටි 103·3 ට වඩා තවමත් බොහෝ සෙයින් අඩුය.

ජාත්‍යන්තර වෙළෙඳාමෙහි සම්පූර්ණ තත්ත්වය, සම්පිණ්ඩණය කොට, II අා–1 සංඛ්‍යා සටහනේ අ ·6 සහ අ ·7 යන ශීර්ෂ වල දක්වා ඇත. මේ අනුව භාණ්ඩ අපනයනයත්, සාධක නොවන සේවාවනුත්, 1961 දී රුපියල් කෝටි 190·7 ක් වුවද, 1962 වන විට රුපියල් කෝටි 197·6 තෙක් වැඩිවී ඇති බව දක්ක හැකිය. 1962 පැවැති මට්ටම 1961 මට්ටමට වඩා වැඩි වුවද, 1959 දී පැවැති ඉහළ මට්ටමට වඩා සියයට 2 කින් අඩුය. භාණ්ඩ සහ සාධක නොවන ආනයනයන් (විනිමය පාලන සංඛ්‍යා පදනම් කොට සැකසූ) 1962 දී රුපියල් කෝටි 206·8 ක් වී තිබිණි. මෙය පසුගිය වසරේදීට වඩා සියයට 4·9 කින් වැඩිය. ආනයන හිනි හිසට ගිය 1960 වසර හා සසඳන විට, 1962 ආනයන සියයට 6·0 කින් අඩුය.

**නිෂ්පාදිතය හා වියදම—මුදලින්**

පවත්නා, සාධක වියදම් මිල අනුව, දළ ජාතික නිෂ්පාදිතය, II අ–2 වැනි සංඛ්‍යා සටහනේ තරමක් සවිස්තරව දක්වා ඇත.

මුළු අපනයන මිල මඳක් අඩුවී ගියද, දේශීය අපනයන වටිනාකම 1962 දී 1961 දීට වඩා සියයට 5·1 කින් වැඩිවිය. කෙසේමුත් අපනයන වටිනාකමෙහි මේ වාසිය ඇතිවූයේ, තේ තොග සැහෙන ප්‍රමාණයකින් අඩුකර ගැනීමෙනි. තේ සහ පොල් ඇතුළු අපනයනය සඳහා කැරුන බෝග නිෂ්පාදනයෙහි, 1962 දී ඇති වූ වැඩිවීම 1961 දී වූ වැඩිවීමට වඩා අඩුය.

දේශීය පාරිභෝජනය සඳහා මෙරට නිපද වූ භාණ්ඩ පිළිබඳ සවිස්තර වාර්තාවක්, පවත්නා නිෂ්පාදක මිල අනුව සකසා II අ–5 සංඛ්‍යා සටහනේ දක්වා ඇත. "කෘෂිකාර්මික", දුව ඇ වන ද්‍රව්‍ය", "පශු සම්පත සහ ධීවර කර්මාන්ත" යන අංශයට මෙරට නිෂ්පාදනයේ දී එකතු වී ඇති වටිනාකම, 1961 දීට වඩා 1962 දී සියයට 3·6 කින් වැඩිය. 1960 දී පැවැති පමණට නොවූවද, මෙය 1961 වසරට වඩා සතුටුදයක වැඩිවීමෙකි. දේශීය නිෂ්පාදනයේ දී කාර්මික, පාරිභෝජන අංශයට එකතු වූ වටිනාකම 1961 වසර හා සසඳන විට, 1962 දී සියයට 19 කින් වැඩි වී ඇත. මෙය 1960 දී ඇති වූ වැඩිවීමට සමාන වන අතර, 1961 වැඩිවීමට වඩා වැඩිය. II අ–2 වැනි සංඛ්‍යා සටහනට අනුව, 1962 දී ප්‍රාග්ධන සංවර්ධනය, පසුගිය දෙවසරටම වඩා තරමක් වැඩිවී ඇති බව දක්ක හැකිය. මෙයට ප්‍රධාන හේතුව වූයේ, රජයේ ව්‍යාපාරවල ප්‍රාග්ධන සංවර්ධනය බොහෝ සෙයින් වැඩිවීමය. පෞද්ගලික අංශයේ සහ, රජයේ සමායතන වල ප්‍රාග්ධන සම්පාදනය 1961 දීට වඩා 1962 දී අඩුවී ඇත. රජයේ ප්‍රාග්ධන සංවර්ධනය වැඩිවී ඇත්තේ ඉතා මඳ වශයෙනි. "ප්‍රවාහණය හා ගමනා ගමනය" නිවාස අයිතිය සහ වෙළෙඳාම යන අර්ථ ක්‍රමයේ, සේවා අංශවල 1962 වසරතුළ සටහන් වී ඇති වර්ධනය අවුරුද්දේ දළ දේශීය නිෂ්පාදිතයේ සාමාන්‍ය වර්ධනයට වඩා වැඩිය.

## ජාතික වියදම-දළ-පවත්නා වෙළෙඳ මිල අනුව

| | රුපියල් දශ ලක්ෂ | | | | වෙනසේ සියයට ගණන | | |
|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1959න් 1960 ට | 1960න් 1961 ට | 1961න් 1962 ට |
| **I. පෞද්ගලික පාරිභෝජනය** | | | | | | | |
| (අ) භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයනය .. .. .. | | | | | | | |
| (i) ආහාර හා අනෙකුත් පෞද්ගලික පාරිභෝජන භාණ්ඩ ආනයන (අ) | 1,793 | 1,932 | 1,724 | 1,781 | + 7·8 | —10·8 | + 3·3 |
| (ii) සාධක නොවන සේවා ආනයනය | 178 | 152 | 137 | 131 | —14·5 | —10·0 | — 4·5 |
| එකතුව .. .. .. | 1,971 | 2,084 | 1,860 | 1,912 | + 5·7 | —10·8 | + 2·8 |
| (ආ) මෙරට නිපදවන භාණ්ඩ (අ) හා සේවා | | | | | | | |
| (i) මෙරට නිපදවන භාණ්ඩ .. | 2,015 | 2,106 | 2,190 | 2,309 | + 4·5 | + 4·0 | + 5·4 |
| (ii) ගෙවල් කුලී .. .. .. | 186 | 197 | 216 | 226 | + 5·9 | + 9·7 | + 4·3 |
| (iii) ප්‍රවාහණය හා පණිවුඩ හුවමාරුව .. | 241 | 256 | 272 | 286 | + 6·2 | + 6·4 | + 4·9 |
| (iv) සේවා අන්තැනෙක නොසඳහන් .. | 467 | 475 | 488 | 506 | + 1·6 | + 2·8 | + 3·6 |
| රජයේ මිලට ගැනීම් හැර .. | —107 | —112 | —139 | —151 | | | |
| එකතුව .. .. .. | 2,803 | 2,921 | 3,028 | 3,175 | + 4·2 | + 3·6 | + 4·9 |
| (ඇ) අනේවාසිකයින් විසින් මිලයට ගත් භාණ්ඩ හා සේවා හැර .. .. | —195 | —169 | —160 | —178 | | | |
| **මුළු පෞද්ගලික පාරිභෝජනය** | **4,579** | **4,837** | **4,728** | **4,908** | **+ 5·6** | **— 2·3** | **+ 3·8** |
| **II. රජයේ පාරිභෝජනය** | | | | | | | |
| (i) භාණ්ඩ හා සේවා සඳහා වර්තන වියදම්—මහ ආණ්ඩුවේ .. .. | 787 | 855 | 873 | 886 | + 8·7 | + 2·0 | + 1·5 |
| (ii) භාණ්ඩ හා සේවා සඳහා වර්තන වියදම්—පලාත් ආණ්ඩු සභාවල .. | 90 | 87 | 74 | 78 | — 3·4 | —15·0 | + 5·8 |
| (iii) රජයේ ගොඩනැගිලි සඳහා ආරෝපිත කුලී .. .. .. | 20 | 21 | 21 | 22 | + 5·0 | — | + 2·4 |
| **එකතුව ..** | **897** | **963** | **968** | **985** | **+ 7·4** | **+ 0·4** | **+ 1·8** |
| **III. දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය—දළ—** | | | | | | | |
| (i) රජයේ .. .. .. | 288 | 268 | 238 | 242 | — 6·7 | —11·2 | + 1·6 |
| (ii) රජයේ ව්‍යාපාර .. .. | 69 | 60 | 74 | 104 | —13·3 | + 23·5 | + 40·3 |
| (iii) පෞද්ගලික අංශය හා රජයේ සමායතන .. .. .. | 676 | 639 | 591 | 639 | — 5·5 | — 7·4 | + 8·0 |
| **එකතුව ...** | **1,033** | **967** | **904** | **985** | **— 6·3** | **— 6·5** | **+ 9·0** |
| **IV. තොග වෙනස්වීම්** | | | | | | | |
| (i) රජයේ .. .. } (ආ) | + 28 | — 4 | — 1 | — 42 | | | |
| (ii) රජයේ ව්‍යාපාර .. } (ආ) | | | | | | | |
| (iii) පෞද්ගලික අංශය හා රජයේ සමායතනය (ඇ) .. .. | + 16 | — 27 | + 11 | — 38 | | | |
| **එකතුව** .. | **+ 44** | **— 31** | **+ 10** | **— 80** | | | |
| **V. දේශීය වියදම—දළ—(ඈ)** | **6,551** | **6,736** | **6,609** | **6,799** | **+ 2·8** | **— 1·9** | **+ 2·9** |
| **VI. පිටරට ආයෝජන—ශුද්ධ** | **—208** | **—221** | **— 94** | **—124** | | | |
| **VII. ජාත්‍යන්තර, ත්‍යාග හා ප්‍රෙෂණ වලින් ලැබීම් (ශුඩ) හැර** | **+ 12** | **— 22** | **— 11** | **— 11** | | | |
| **VIII. ජාතික වියදම—දළ** .. .. | **6,355** | **6,494** | **6,505** | **6,664** | **+ 2·2** | **+ 0·2** | **+ 2·4** |

(අ) සිල්ලර වටිනාකම අනුව
(ආ) ආනයන හාල්, තිරිඟු පිටි හා සීනි සහතික මිලට පත් වී අරක්කු වල තොග වෙනස්වීම් පමණයි.
(ඇ) තේ, රබර් සහ පශු සම්පත් තොග වෙනස්වීම් පමණයි
(ඈ) පාරිභෝජන වියදම් දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය—දළ—සහ තොග වෙනස්වීම් සමානයි
(ඉ) පිටරට ආයෝජන—ශුද්ධ—මෙරට වර්තන ගිණුමේ අතිරික්තය

පවත්නා වෙළෙඳ මිල අනුව දළ ජාතික වියදම් පිළිබඳ සවිස්තර (අවක්‍ර) ඇස්තමේන්තු II අ–3 වැනි සටහනේ දක්වා ඇත. 1961 දී සියයට, 10·8 කින් පහළ වැටුන පෞද්ගලික පාරි

භෝජනය සඳහා වූ ආනයන භාණ්ඩ හා සේවා සිල්ලර වටිනාකම, 1962 දී සියයට 2·8 කින් ඉහළ ගියේය. පෞද්ගලික පාරිභෝජනය සඳහා මෙරට නිපද වූ භාණ්ඩ සහ සේවාවල සිල්ලර වටිනාකම 1962 දී සියයට 4·9 කින් ඉහළ ගියේය. 1961 දී මෙය ඉහළ ගියේ සියයට 3·6 කිනි. රජයේ පාරිභෝජනයට ගත් භාණ්ඩ හා සේවා, පසුගිය වසරට වඩා 1961 දී වැඩිවූයේ ඉතා සුළු වශයෙන් වුවද, 1962 දී එය සියයට 1·8 කින් වැඩිවිය. රජයේ ව්‍යාපාර අංශයේ, දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය, 1962 දී සියයට 40·3 කින් වැඩිවී ඇති අතර, පෞද්ගලික අංශයේ සහ රජයේ සමායතන අංශයේ ඒකාබද්ධ වැඩිවීම සියයට 8·0 කි.

සංඛ්‍යා සටහන II අ—4

## (දළ) ජාතික නිෂ්පාදිත වියදම පවත්නා මිල අනුව

රුපියල් දශ ලක්ෂ

| | 1959 | 1960 | 1961 | 1962 |
|---|---|---|---|---|
| 1. ජාතික නිෂ්පාදිතය–දළ–සාධක මිල අනුව .. | 5,835 | 6,020 | 6,067 | 6,313 |
| 2. අනියම් බදු (අ) ආධාර අඩු කොට | 389 | 413 | 389 | 422 |
| **3. ජාතික නිෂ්පාදිතය-දළ-වෙළෙඳ මිල අනුව** | **6,224** | **6,433** | **6,457** | **6,736** |

| | 1959 | 1960 | 1961 | |
|---|---|---|---|---|
| 4. පාරිභෝජන වියදම: පෞද්ගලික.. .. | 4,579 | 4,837 | 4,728 | 4,908 |
| 5. පාරිභෝජන විදයම: රජයේ .. .. | 897 | 963 | 968 | 985 |
| 6. දේශීය ප්‍රාග්ධන සම්පාදනය–දළ පෞද්ගලික අංශය සහ රජයේ සමායතන .. | 691 | 611 | 602 | 601 |
| 7. දේශීය ප්‍රාග්ධන සම්පාදනය–දළ : රජයේ හා රජයේ ව්‍යාපාර .. .. | 385 | 325 | 312 | 304 |
| 8. දේශීය වියදම–දළ–(ආ) .. .. .. | 6,551 | 6,736 | 6,609 | 6,799 |
| 9. භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයනය .. .. | 2,016 | 2,011 | 1,907 | 1,976 |
| 10. භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන හැර .. .. | -2,176 | -2,209 | -1,972 | -2,068 |
| 11. දේශීය නිෂ්පාදිත වියදම–දළ–වෙළෙඳ මිල අනුව .. .. | 6,392 | 6,538 | 6,545 | 6,707 |
| 12. පිටරටින් ලැබුන සාධක ආදයම–ශුද්ධ– | — 37 | — 44 | — 40 | — 43 |
| 13. ඉතිරි: තොගවල නොදත් වෙනස්කම් හා සංඛ්‍යා විෂමතා .. | —131 | — 61 | — 48 | + 72 |
| **14. ජාතික නිෂ්පාදිත වියදම—දළ: වෙළෙඳ මිල අනුව** (ඇ) .. .. | **6,224** | **6,433** | **6,457** | **6,736** |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(අ) පලාත් ආණ්ඩු සභා බදු අයත් වෙයි.

(ආ) පාරිභෝගික වියදම හා ජාතික ප්‍රාග්ධන සම්පාදනය–දළ–වියදම් සමාන වෙයි.

(ඇ) මේ සංඛ්‍යා සටහනෙහි–ශීර්ෂ 11 සහ 12 විජත ඓක්‍යය–දළ ජාතික වියදමට සමානය. මෙය මේ සංඛ්‍යා සටහනේ 14 වැනි ශීර්ෂයට වඩා වෙනස් වෙන්නේ (දළ ජාතික නිෂ්පාදිත වියදම (II (අ) 3 සංඛ්‍යා සට හනේ 8 ශීර්ෂය) වෙළෙඳ මිල අනුව) 13 වැනි ශීර්ෂයේ දක්වා ඇති ප්‍රමාණයෙන් පමණකි. (තොග වල නොදත් වෙනස්කම් හා සංඛ්‍යා විෂමතා)

දළ දේශීය වියදම එනම්, පෞද්ගලික හා රජයේ පාරිභෝජනය, දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය, සහ තොග වෙනස්වීම් වල එකතුව, II අ-3 වැනි සංඛ්‍යා සටහනේ, V වැනි ශීර්ෂයේ දක්වා ඇත. දළ දේශීය වියදම, දළ ජාතික වියදමින් (සංඛ්‍යා සටහනේ VIII ශීර්ෂය) වෙනස් වෙයි. මේ වෙනස ජාත්‍යන්තර, ත්‍යාග හා පැවරීම් හැර, පිටරට ශුද්ධ ආයෝජන පමණට වෙයි. 1959 සිට 1962 දක්වා වූ, තෙවසේ ඒ ඒ වර්ෂවල පිටරට ශුද්ධ ආයෝජන වල විශාල රිනයක් ඇති විය. මේ නිසා දළ ජාතික වියදම දළ දේශීය වියදමට වඩා බොහෝ සෙයින් අඩුය.

ප්‍රත්‍ය වශයෙන් බලන කල, පවත්නා වෙළෙඳ මිල අනුව වූ දළ ජාතික වියදම, ආධාර අඩුකොට, අනියම් බදු සඳහා ගලපා ගත්, පවත්නා සාධක වියදම් මිල අනුව වූ දළ ජාතික නිෂ්පාදිතයනට සමානය. එහෙත්, වෙන වෙනම සකසා ඇති දළ ජාතික නිෂ්පාදිත ඇස්තමේන්තු සහ දළ ජාතික වියදම් ඇස්තමේන්තු සසඳන, II අ-4 වැනි සංඛ්‍යා සටහනට අනුව, නිෂ්පාදිත සහ වියදමේ මුළු ගණන් වල වෙනස්කම් තිබෙන බවද දක්ක හැකිය. මෙය සංඛ්‍යා සටහනේ 13 වැනි ශීර්ෂයෙන් දක්වේ. 1962 සඳහා වූ මෙහි වෙනස රුපියල් කෝටි 7·2 ක් විය. මෙය පසුගිය අවුරුදු වල සංඛ්‍යා වලට වඩා වැඩිය. එහෙත් 1959 සංඛ්‍යාවලට වඩා අඩුය. නිෂ්පාදිත හා වියදම් සංඛ්‍යා සටහන් සැකසීමට රේගු සහ ජාත්‍යන්තර ගනුදෙනු සංඛ්‍යා තොරතුරු යොදා ගෙන ඇත. අවුරුද්ද තුළ ගෙන්වන ලද වෙළෙඳ හා ණ්ඩ පිළිබඳ, සංඛ්‍යා තොරතුරු රේගු වාර්තා වල හා ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාවල වෙනස්ව ඇතුළත් වී තිබීම, 1962 දී මේ වෙනස ඇති වීමට හේතු වූවා විය හැකිය.

සංඛ්‍යා සටහන II අ—5

## දේශීය පාරිභෝජනය සඳහා මෙරට නිපද වූ භාණ්ඩ—පවත්නා නිෂ්පාදක මිල අනුව

| | රුපියල් දශ ලක්ෂ | | | | වෙනසේ සියයට ගණන | | |
|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1959න් 1960ට | 1960න් 1961ට | 1961න් 1962ට |
| **(i) කෘෂිකර්මය, දැව ඈ වන ද්‍රව්‍ය, පශු සම්පත සහ ධීවර කර්මාන්තය** | | | | | | | |
| හාල් .. .. .. .. | 400 | 472 | 475 | 524 | +18·2 | + 0·6 | +10·4 |
| පොල් හා පොල් නිෂ්පාදිත .. .. | 208 | 168 | 147 | 135 | —19·4 | —12·2 | — 8·1 |
| තේ .. .. .. .. | 53 | 55 | 56 | 58 | + 3·8 | + 2·4 | + 3·2 |
| අනෙකුත් ආහාර බෝග .. .. | 327 | 352 | 385 | 380 | + 7·7 | + 9·3 | — 1·1 |
| දුම්කොළ .. .. .. .. | 14 | 14 | 15 | 17 | — | + 8·6 | +13·8 |
| බුලත් සහ පුවක් .. .. .. | 34 | 37 | 38 | 34 | + 7·3 | + 1·6 | — 8·3 |
| දර .. .. .. .. | 14 | 14 | 15 | 15 | — | + 4·3 | — |
| පශු සම්පත් .. .. .. | 145 | 135 | 136 | 136 | — 6·8 | + 0·5 | — |
| මාලු .. .. .. .. | 60 | 69 | 86 | 101 | +13·9 | +25·3 | +17·1 |
| විවිධ කෘෂිකර්ම හා වන ද්‍රව්‍ය නිෂ්පාදන .. | 49 | 52 | 53 | 55 | + 4·9 | + 2·9 | + 3·6 |
| පාවිච්චි කළ ආනයන භාණ්ඩ හැර* .. | —25 | —25 | —25 | —27 | | | |
| දේශීය නිෂ්පාදනය නිසා එකතු වූ වටිනාකම | 1,279 | 1,342 | 1,380 | 1,430 | + 5·0 | + 2·9 | + 3·6 |
| **(ii) කර්මාන්ත (ප්‍රාග්ධන සංවර්ධනය අත්හැර)** | | | | | | | |
| කම්හල් .. .. .. .. | 314 | 379 | 416 | 454 | +20·8 | + 9·8 | + 9·0 |
| ගෘහ කර්මාන්ත .. .. .. | 110 | 113 | 116 | 119 | + 2·5 | + 2·9 | + 2·9 |
| පාවිච්චියට ගත් ආණයන භාණ්ඩ හැර* .. | —168 | —187 | —191 | —167 | | | |
| දේශීය නිෂ්පාදනය නිසා එකතු වූ වටිනාකම | 255 | 305 | 342 | 406 | +19·3 | +12·1 | +19·0 |

*වෙළෙඳ වටිනාකම අනුව

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුව, ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, කර්මාන්ත දෙපාර්තමේන්තුව, ධීවර දෙපාර්තමේන්තුව ආදියෙනි.

පෞද්ගලික පාරිභෝජන වියදම්, ආනයන වියදම් ශීර්ෂ යටතේ සහ මෙරට නිපද වූ භාණ්ඩ හා සේවා වියදම් ශීර්ෂ යටතේ වර්ගකොට, II අ–6 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත. මේ සටහනට අනුව, පිටරටින් ගෙන්වන හාල්, කිරිහු පිටි, සහ සීනි පාරිභෝජනයේ වටිනාකම, 1960 සිටම වැඩිවන බව හෙළි වේ. අනෙක් අතට පිටරටින් මිලයට ගනු ලබන සාධක නොවන සේවා කෙමෙන් අඩුවන අතට හැරී ඇති බව දක්වේ. පිටරටින් ගෙන්වන අනෙකුත් භාණ්ඩ පාරිභෝජනය, 1962 දී 1961 දීට වඩා තරමක් වැඩි වුවද, 1960 දීට වඩා බොහෝ සෙයින් අඩුවී ඇත. මෙරට නිපදවන හා  ඩ හා සේවා සම්බන්ධයෙන්, මෙරට නිපදවන හාල් සඳහා වියදම සියයට 11·2 කින් ද මාලු සඳහා වියදම සියයට 17·0 කින් ද කාර්මික නිෂ්පාදිත සඳහා වියදම සියයට 10·2 කින් ද වැඩි වී ඇත.

සංඛ්‍යා සටහන II අ—6

## පෞද්ගලික පාරිභෝජන වියදම් සැකසුම—පවත්නා වෙළෙඳ මිල අනුව

| | රුපියල් දශ ලක්ෂ | | | | වෙනසෙහි සියයට ගණන | | |
|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1959න් 1960ට | 1960න් 1961ට | 1961න් 1962ට |
| **අ. භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයනය.** | | | | | | | |
| (i) සහල්, කිරිහු පිටි, සහ සීනි .. | 490 | 488 | 522 | 545 | — 0·3 | + 7·0 | + 4·4 |
| (ii) අනෙකුත් පෞද්ගලික පාරිභෝජන භාණ්ඩ .. .. .. | 1,304 | 1,444 | 1,201 | 1,236 | +10·8 | —16·8 | + 2·9 |
| (iii) සාධක නොවන සේවා .. .. | 178 | 152 | 137 | 131 | —14·5 | —10·0 | — 4·5 |
| **එකතුව .. .. ..** | **1,971** | **2,084** | **1,860** | **1,912** | **+ 5·7** | **—10·8** | **+ 2·8** |
| **ආ. මෙරට නිපදවුනු භාණ්ඩ හා සේවා** | | | | | | | |
| (i) මෙරට නිපැදවුණු භාණ්ඩ .. .. | | | | | | | |
| හාල් .. .. .. .. | 312 | 308 | 275 | 306 | — 1·5 | —10·6 | +11·2 |
| පොල් නිෂ්පාදිත .. .. | 232 | 187 | 162 | 154 | —19·4 | —13·4 | — 4·8 |
| තේ .. .. .. .. | 62 | 66 | 69 | 74 | + 6·8 | + 4·7 | + 7·0 |
| අනෙකුත් ආහාර බෝග .. .. | 398 | 435 | 476 | 474 | + 9·3 | + 9·4 | — 0·5 |
| දුම්කොළ .. .. .. | 20 | 20 | 22 | 25 | — | + 8·5 | +13·8 |
| බුලත් පුවක් .. .. .. | 46 | 50 | 50 | 46 | + 7·1 | — | — 8·3 |
| දර .. .. .. .. | 15 | 16 | 17 | 17 | + 3·3 | + 4·4 | |
| පශු සම්පත .. .. .. | 174 | 168 | 185 | 181 | — 3·5 | +10·1 | — 2·4 |
| මාලු .. .. .. .. | 80 | 92 | 115 | 134 | +13·9 | +25·5 | +17·0 |
| විවිධ කෘෂිකාර්මික දූව ඈ වන ද්‍රව්‍ය .. .. .. | 57 | 59 | 61 | 63 | + 4·9 | + 2·9 | + 3·6 |
| කාර්මික නිෂ්පාදිත .. .. | 619 | 706 | 759 | 836 | +14·1 | + 7·5 | +10·2 |
| එකතුව .. .. .. | 2,015 | 2,106 | 2,190 | 2,309 | + 4·5 | + 4·0 | + 5·4 |
| (ii) ගෙවල් කුලී .. .. .. | 186 | 197 | 216 | 226 | + 5·9 | + 9·7 | + 4·3 |
| (iii) ප්‍රවාහණය හා පණිවුඩ හුවමාරුව .. | 241 | 256 | 272 | 286 | + 6·2 | + 6·4 | + 4·9 |
| (iv) සේවා–අන් තැනෙක නොසඳහන් .. | | | | | | | |
| පුද්ගලයන්ගේ මූල්‍ය සේවා (1) .. | 13 | 14 | 15 | 16 | + 8·5 | + 7·1 | + 8·0 |
| ක්‍රීඩා සහ විනෝද .. .. | 24 | 25 | 26 | 27 | + 3·3 | + 3·2 | + 2·7 |
| ගෘහ සේවා .. .. .. | 200 | 203 | 209 | 218 | + 1·5 | + 3·1 | + 4·0 |
| හෝටල් සහ ආපන ශාලා .. .. | 119 | 121 | 125 | 130 | + 1·5 | + 3·1 | + 4·0 |
| වෘත්තීය සහ ආයතන සේවා–අන්තැනක නොසඳහන් (2) .. .. | 61 | 61 | 61 | 61 | — | — | — |
| පෞද්ගලික සේවා අන් තැනෙක නොසඳහන් (3) .. .. .. | 50 | 51 | 52 | 54 | + 1·4 | + 3·2 | + 4·0 |
| එකතුව .. .. .. | 467 | 475 | 488 | 506 | + 1·6 | + 2·8 | + 3·6 |
| රජය මෙරටින්මිලදී ගැනීම් හැර .. | —107 | —112 | —139 | —151 | | | |
| **මුළු එකතුව .. .. ..** | **2,803** | **2,921** | **3,028** | **3,175** | **+ 4·2** | **+ 3·6** | **+ 4·9** |
| **ඇ. අනේවාසිකයන් විසින් මිලදී ගත් භාණ්ඩ හා සේවා හැර .. ..** | **—195** | **—169** | **—160** | **—178** | | | |
| **මුළු පෞද්ගලික පාරිභෝජනය ..** | **4,579** | **4,837** | **4,728** | **4,908** | **+ 5·6** | **— 2·2** | **+ 3·8** |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(1) ව්‍යාපාරවලින් බාහිරව, බැංකු, රක්ෂණ සමාගම්, සහ අනෙකුත් මූල්‍ය ආයතන විසින් ගෙවැසියනට, කරන ලද, සේවාවන් ගේ වටිනාකම

(2) පෞද්ගලික වෛද්‍ය නීති හා අධ්‍යාපනික සේවා සහ ලාභ නූපයන, පුද්ගල මණ්ඩල (ආගමික සහ සුභසාධක සංවිධාන සහ වෘත්තීය සමිති ආදිය) වලින් කරන ලද සේවා

(3) ඩෝබි, බාබර්, දෛවඥ සහ අවමගුල් කටයුතු භාර ගන්නන් විසින් කරන ලද සේවා

දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය පිළිබඳ, සවිස්තර විග්‍රහවක් II අ–7 වැනි සටහනේ දැක්වේ. පෞද්ගලික අංශයේ සහ රජයේ සමායතන වල දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය, වත්කම් වර්ග අනුව බෙදා දක්වා ඇත. මේ වර්ග කිරීම් අනුව, දැක්වෙන පරිදි 1962 ප්‍රාග්ධන සම්පාදනය ප්‍රධාන වශයෙන්ම වැඩි වී ඇත්තේ, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සහ ගමනා ගමන උපකරන සම්බන්ධයෙනි. රජයේ හෝ රජයේ ව්‍යාපාර එකට ගත්විට එහි ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය, 1962 දී සියයට 10·8 කින් වැඩිවී ඇත. පසුගිය වසරේදී මෙය සියයට 4·9 කින් පහළ වැටිණි. 1962 දී පෞද්ගලික අංශයේ තොග* (හඳුනාගත හැකි) කෝටි 3·8 කින් අඩුවී ඇති බව සංඛ්‍යා සටහනින් දැක්වේ. රාජ්‍ය අංශයේ පිටරටින් ගෙන්වන, හාල්, තිරිඟු, පිටි, සහ සීනි තොග, රුපියල් කෝටි 8·7 කින් පමණ අඩු වී ඇත. එහෙත් සහතික මිල ක්‍රමයට ගනු ලැබූ වී තොග රුපියල් කෝටි 4·5 කින් වැඩිවීම නිසා මෙය තරමක් මැකී ගියේය.

සංඛ්‍යා සටහන II අ—7

## ජාතික ප්‍රාග්ධන සම්පාදනය - දළ - පවත්නා වෙළෙඳ මිල අනුව

| | රුපියල් දශ ලක්ෂ | | | | වෙනසේ සියයට ගණන | | |
|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1959න් 1960ට | 1960න් 1961ට | 1961න් 1962ට |
| **(අ) පෞද්ගලික අංශය සහ රජයේ සමායතන** | | | | | | | |
| (i) දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය දළ .. | | | | | | | |
| වගාකිරීම හා නැවත වගා කිරීම .. .. | 63 | 62 | 61 | 56 | — 1·3 | — 0·6 | — 8·8 |
| ගොඩනැගිලි සහ අනෙකුත් සමහර ඉදි කිරීම්.. | 336 | 341 | 336 | 346 | + 1·7 | — 1·6 | + 3·2 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ .. .. | 99 | 76 | 100 | 124 | —23·3 | +30·9 | +24·2 |
| ප්‍රවාහණය .. .. .. .. | 121 | 103 | 40 | 64 | —15·3 | —60·8 | +59·3 |
| ආනයන කළ ප්‍රාග්ධන භාණ්ඩ (අන්තැනෙක නොසඳහන්).. .. .. .. | 57 | 57 | 54 | 49 | — | — 4·4 | —10·5 |
| එකතුව .. .. .. .. | 676 | 639 | 591 | 639 | — 5·5 | — 7·4 | + 8·0 |
| (ii) තොග වෙනස්වීම | | | | | | | |
| තේ .. .. .. .. .. | + 3 | —10 | — 2 | —41 | | | |
| රබර් .. .. .. .. .. | — 3 | —27 | +19 | + 3 | | | |
| පශු සම්පත් .. .. .. .. | +15 | + 9 | — 5 | ... | | | |
| එකතුව .. .. .. .. | +16 | —27 | +11 | —38 | | | |
| ජාතික ප්‍රාග්ධන සම්පාදනය .. .. | 691 | 611 | 602 | 601 | —11·6 | —1·5 | —0·2 |
| **(ආ) රජය සහ පොදු ව්‍යාපාර** | | | | | | | |
| (i) දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය–දළ .. | 357 | 329 | 313 | 346 | — 8·0 | — 4·9 | +10·8 |
| (ii) තොග වෙනස්වීම .. .. .. | | | | | | | |
| ආනයනකළ හාල් – තිරිඟු පිටි හා සීනි .. | +64 | —13 | —65 | —87 | | | |
| සහතික මිලට ගත් වී .. .. .. | —35 | +10 | +65 | +45 | | | |
| අරක්කු.. .. .. .. .. | — 1 | ... | — 2 | ... | | | |
| එකතුව.. .. .. .. .. | +28 | — 4 | — 1 | —42 | | | |
| ජාතික ප්‍රාග්ධන සම්පාදනය .. .. | 385 | 325 | 312 | 304 | —15·7 | — 3·9 | — 2·4 |

සංඛ්‍යා — ශ්‍රී ලංකා මහ බැකුවෙනි.

*හඳුනාගත් තොග වෙනස්වීම් වල, තේ, රබර් සහ පශු සම්පත්, වල තොග වෙනස්වීම් ගැනේ. පෞද්ගලික අංශයේ ආනයන තොග වෙනස්වීම් සම්බන්ධයෙන් විශ්වාසදායි සංඛ්‍යා තොරතුරු ලැබී නොමැත.

**තිබෙන සම්පත් මාර්ග හා ප්‍රයෝජන**

දේශීය නිෂ්පාදනයෙන් හා ජාත්‍යන්තර වෙළෙඳාමේ, පාවිච්චිය අනුව දක්වෙන පරිදි, පාරිභෝජනය, ප්‍රාග්ධන සම්පාදනය හා අපනයනය සඳහා අර්ථ ක්‍රමයෙහි තිබෙන සම්පත් මාර්ග II අ–8 වැනි සංඛ්‍යා සටහනේ දක්වේ. සම්පත් මාර්ග සම්බන්ධයෙන්, 1962 දී දළ දේශීය නිෂ්පාදිතය, සියයට 2·5 කින් වැඩි වී ඇති අතර, භාණ්ඩ ආනයනය සහ, සාධක නොවන සේවා සියයට 4·9 කින් වැඩි වී ඇත. මේ අනුව අර්ථ ක්‍රමයේ තිබෙන සම්පත් මාර්ග, සුළු වශයෙන් සියයට 3·0 කින් වැඩි වී ඇත. මෙය මුළු පාරිභෝජනය, සියයට 3·5 කින් වැඩි කිරීමටත් අපනයනය සියයට 3·6 කින් වැඩි කිරීමටත් යොදු ගන්නා ලදී. එහෙත් මේ වැඩි කිරීම් නිසා මුළු ප්‍රාග්ධන සම්පාදනය (තොග වෙනස්වීම් ද ගණනට ගෙන) සියයට 1·0 කින් අඩු කිරීමට සිදු විය.

සංඛ්‍යා සටහන II අ—8

## ධනමාර්ග සහ ඒ උපයෝගි කරගැනීම—පවත්නා වෙළෙඳ මිල අනුව

| | රුපියල් දශ ලක්ෂ | | | | වෙනසේ සියයට ගණන | | |
|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1959න් 1960 ට | 1960න් 1961 ට | 1961න් 1962 ට |
| **(අ) ධන මාර්ග** | | | | | | | |
| ජාතික නිෂ්පාදිතය–දළ (1) .. .. | 6,392 | 6,538 | 6,545 | 6,707 | + 2·3 | + 0·1 | + 2·5 |
| භාණ්ඩ සහ සාධක නොවන සේවා ආනයනය .. .. .. | 2,176 | 2,209 | 1,972 | 2,068 | + 1·5 | —10·7 | + 4·9 |
| **එකතුව** .. .. .. | **8,567** | **8,746** | **8,517** | **8,775** | **+ 2·1** | **— 2·6** | **+ 3·0** |
| **(ආ) උපයෝගි කර ගැනීම** | | | | | | | |
| පාරිභෝජනය .. .. .. | 5,475 | 5,800 | 5,695 | 5,894 | + 5·9 | — 1·8 | + 3·5 |
| ජාතික ප්‍රාග්ධන සම්පාදනය–දළ .. | 1,076 | 936 | 914 | 905 | —13·0 | — 2·3 | — 1·0 |
| භාණ්ඩ සහ සාධක නොවන සේවා අපනයනය.. .. .. .. | 2,016 | 2,011 | 1,907 | 1,976 | — 0·3 | — 5·1 | + 3·6 |
| **එකතුව** .. .. .. | **8,567** | **8,746** | **8,517** | **8,775** | **+ 2·1** | **—2·6** | **+ 3·0** |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(1) II අ 2 සංඛ්‍යා සටහනේ 3 වැනි ශීර්ෂය වන මෙය, වියදම් අංශයේ පාරිභෝජන හා ප්‍රාග්ධන සම්පාදන ඇස්තමේන්තුවලට සරිලන සේ, ආධාර හැර, අනියම් බදු සඳහා ද, (IIඅ–4 සංඛ්‍යා සටහනේ 2 වැනි ශීර්ෂය තොගවල නොදත් වෙනස්කම් හා සංඛ්‍යා විෂමතා (II අ 4 සංඛ්‍යා සටහනේ 13 වැනි ශීර්ෂය) ද සමග ගලපා ඇත.

ජාත්‍යන්තර ගනුදෙනු සම්බන්ධයෙන්, ලංකාව, "ආදයම ඉක්මවා යැපීමට වැය කරන්නේද" යන ප්‍රශ්නයට, පිළිතුරක් සැපයීමට, II අ–9 වැනි සංඛ්‍යා සටහනින් උත්සාහයක් දරා ඇත. මේ සංඛ්‍යා සටහනේ 1 සිට 5 දක්වා ඇති ශීර්ෂවලින්, දළ දේශීය වියදම් සැකසුම දක්වෙයි. 7 වැනි ශීර්ෂයෙන් වෙළෙඳ මිල අනුව, දළ ජාතික නිෂ්පාදිතය හෙවත්, නිෂ්පාදනය සඳහා කරගෙන යන උත්සාහයන්ගේ ප්‍රතිඵල වශයෙන් රැස්වන, සම්පත් මාර්ග, දක්වෙයි. දළ දේශීය වියදම, දළ දේශීය නිෂ්පාදිතය ඉක්මවා ගිය හොත්, එසේ ඉක්මවා යන ප්‍රමාණය, පිටරට වත්කම් නිරායෝජනය කිරීමෙන් හෝ (විදේශීය වත්කම් වලින් ගැනීමෙන් හෝ, විදේශීය වගකීම වැඩිකර ගැනීමෙන්) ජාත්‍යන්තර, ත්‍යාග සහ පැවරුම් ලබා ගැනීමෙන්, පියවාගත යුතුය

මේ සංඛ්‍යා සටහනින් දැක්වෙන පරිදි, 1959 දී දළ ජාතික වියදම, දළ ජාතික නිෂ්පාදිතයට වඩා සියයට 3·1 කින් වැඩිවී ඇත. 1960 දී එය සියයට 3·7 කින් ද, 1961 සියයට 1·6 කින් ද, 1962 දී සියයට 2·0 කින් ද, වැඩි වී ඇත. මේ වැඩිවියදම හැම අවුරුද්දකම ලබාගෙන ඇත්තේ, පිටරට වත්කම් නිරායෝජනය කිරීමෙනි. 1959 දී හැර අනෙක් අවුරුදු වලදී මේ වියදම පියවා ගැනීමට ජාත්‍යන්තර ත්‍යාග හා පැවරීම් සුළු වශයෙන් ලැබී ඇත.

සංඛ්‍යා සටහන II අ—9

## ජාතික වියදම-දළ-සහ තිබෙන ධන මාර්ග පවත්නා වෙළෙඳ මිල අනුව

| | 1959 | | 1960 | | 1961 | | 1962 | |
|---|---|---|---|---|---|---|---|---|
| | රුපියල් දශ ලක්ෂ | 7 වැනි පෙළේ සියයට ගණන | රුපියල් දශ ලක්ෂ | 7 වැනි පෙළේ සියයට ගණන | රුපියල් දශ ලක්ෂ | 7 වැනි පෙළේ සියයට ගණන | රුපියල් දශ ලක්ෂ | 7 වැනි පෙළේ සියයට ගණන |
| 1. පාරිභෝජන වියදම : පෞද්ගලික .. .. | 4,579 | 72·0 | 4,837 | 74·5 | 4,728 | 72·7 | 4,908 | 73·7 |
| 2. පාරිභෝජන වියදම : රජයේ .. .. | 897 | 14·1 | 963 | 14·8 | 968 | 14·9 | 985 | 14·8 |
| 3. දේශීය ප්‍රාග්ධන සම්පාදනය-දළ .. .. පෞද්ගලික අංශය සහ රජයේ සමායතන .. | 691 | 10·9 | 611 | 9·4 | 602 | 9·3 | 601 | 9·0 |
| 4. දේශීය ප්‍රාග්ධන සම්පාදනය- දළ- රජයේ ව්‍යාපාර .. .. }<br>5. දේශීය ප්‍රාග්ධන සම්පාදනය දළ-රජයේ .. } | 385 | 6·1 | 325 | 5·0 | 312 | 4·8 | 304 | 4·6 |
| 6. දේශීය වියදම-දළ- .. | 6,551 | 103·1 | 6,736 | 103·7 | 6,609 | 101·6 | 6,799 | 102·0 |
| 7. ජාතික නිෂ්පාදිතය දළ (ගලපා) * .. | 6,355 | 100·0 | 6,494 | 100·0 | 6,505 | 100·0 | 6,664 | 100·0 |
| 8. ශීර්ෂ (6) ශීර්ෂ (7) ට වැඩි කොටස ලැබුනේ .. | | | | | | | | |
| (අ) පිටරට ආයෝජන (ශුද්ධ) අඩු කිරීමෙන් | 208 | 3·3 | 221 | 3·4 | 94 | 1·4 | 124 | 1·9 |
| (ආ) ජාත්‍යන්තර, ත්‍යාග හා ප්‍රේෂණ ලැබීමෙන් (ශුද්ධ) .. | — 12 | —0·2 | 22 | 0·3 | 11 | 0·2 | 11 | 0·2 |
| (අ) + (ආ) | 196 | 3·1 | 242 | 3·7 | 105 | 1·6 | 135 | 2·0 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* දළ ජාතික වියදම් පිළිබඳ සංඛ්‍යා සටහනින් (සංඛ්‍යා සටහන II අ 3) ගනු ලැබූ, මේ සංඛ්‍යා සටහනේ දැක්වෙන අනෙකුත් ශීර්ෂ සමග ඒකාකාරිත්වයක් ඇතිවනු සඳහා II අ 4 සංඛ්‍යා සටහනින් 3 වැනි ශීර්ෂය වශයෙන් දක්වා ඇති පවත්නා වෙළෙඳ මිල අනුව වූ දළ ජාතික නිෂ්පාදිත වියදම් සංඛ්‍යා එම සටහනේ 13 වැනි ශීර්ෂය සමග ගලපා ඇත.

සංඛ්‍යා සටහන II අ–10

## (දළ) ජාතික වියදම් සැකසුමේ අඩංගු ආනයන

රුපියල් දශ ලක්ෂ

| | 1959 | | | | 1960 | | | | 1961 | | | | 1962 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පෞද්ගලික පාරිභෝජනය | රජයේ පාරිභෝජනය | දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | තොග වෙනස් වීම | පෞද්ගලික පාරිභෝජනය | රජයේ පාරිභෝජනය | දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | තොග වෙනස් වීම | පෞද්ගලික පාරිභෝජනය | රජයේ පාරිභෝජනය | දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | තොග වෙනස් වීම | පෞද්ගලික පාරිභෝජනය | රජයේ පාරිභෝජනය | දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | තොග වෙනස් වීම |
| 1. වියදම (වෙළෙඳ මිල අනුව) .. .. | 4,579 | 897 | 1,033 | +43·5 | 4,837 | 963 | 967 | —31·4 | 4,728 | 968 | 904 | +10·2 | 4,908 | 985 | 985 | —80·1 |
| 2. ආනයන අඩංගුව (මී.ර.ගැ. මිල අනුව) (අ) ප්‍රමාණය .. | 1,449 | 87 | 372 | +63·8 | 1,410 | 125 | 365 | —13·4 | 1,199 | 70 | 309 | —64·5 | 1,149 | 56 | 358 | —87·1 |
| (ආ) සියයට ගණන .. | 31·6 | 9·7 | 36·0 | | 29·2 | 12·9 | 37·8 | | 25·4 | 7·2 | 34·2 | | 23·4 | 5·7 | 36·3 | |
| 3. ආනයන අඩංගුව වෙළෙඳ මිල අනුව* (අ) ප්‍රමාණය .. | 1,971 | 89 | 518 | +63·8 | 2,084 | 127 | 496 | —13·4 | 1,860 | 72 | 436 | —64·5 | 1,912 | 58 | 504 | —87·1 |
| (ආ) සියයට ගණන .. | 43·0 | 9·9 | 50·2 | | 43·1 | 13·2 | 51·3 | | 39·3 | 7·5 | 48·2 | | 38·9 | 5·8 | 51·2 | |

*රජයේ (රාජ්‍ය ආරක්ෂක) ආනයන සහ ආනයන තොග වෙනස්වීම් අගය කොට ඇත්තේ මී.ර.ගැ.මිල අනුවය.
ආනයන කළ අනෙකුත් හැම වෙළෙඳ භාණ්ඩයක් ම සිල්ලර මිලට අගය කොට ඇත.

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

සම්පත් මාර්ග සැකසුම හා එහි ප්‍රයෝජනය II අ–9 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වේ. එහි දළ දේශීය වියදම්, සැකසුමෙහි ඒ ඒ කොටස් වල දළ දේශීය නිෂ්පාදිතයට ඇති සියයට ගණන දක්වේ. දළ දේශීය නිෂ්පාදිතයේ මුළු පාරිභෝජන වියදම 1962 දී සියයට 88·5 තෙක් වැඩි විය. පසුගිය අවුරුද්දේ පැවැති සංඛ්‍යාව සියයට 87·6 ක් විය. එහෙත්, පසුගිය අවුරුද්දේ සියයට 14·1 ක් වූ දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය, 1962 දී සියයට 13·6 තෙක් පහළ වැටිණි. මේ සංඛ්‍යා අනුව, ප්‍රාග්ධන සම්පාදනයට වඩා පාරිභෝජනය සඳහා වූ වියදම් 1961 දීට වඩා තරමක් වැඩිවී ඇති බව හෙළි වේ.

දළ දේශීය වියදමට අඩංගු වී ඇති ඒ ඒ ආනයනයන් II අ–10 වැනි සංඛ්‍යා සටහනින් විග්‍රහ කැරේ. පෞද්ගලික පාරිභෝජනයට, රජයේ පාරිභෝජනයට, සහ දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයට ගිය වියදමත්, තොග වෙනස්වීමත්, මෙහි වෙන වෙන ම දක්වා ඇත. දළ දේශීය වියදම් සැකසුමේ ඒ ඒ අංශය ඉදිරියෙන් එම වියදමට අඩංගු ආනයන ප්‍රමාණය මි.ර.ගැ. මිල හා වෙළෙඳ වටිනාකම අනුව දක්වා ඇත.

මේ විග්‍රහවෙන් දක්ක හැකි වැදගත් කරුණක් නම්, පෞද්ගලික පාරිභෝජනයට ගැනෙන මි.ර.ගැ. මිලට වූ ආනයන අඩංගුව, 1959 සිට 1962 වන විට සියයට 31·6 සිට සියයට 23·4 තෙක් පහළ වැටී තිබීමය. වෙළෙඳ වටිනාකම අනුව, මේ පහළ වැටීම මෙයට වඩා අඩුය. 1959 දී සියයට 43·0 ක් වූ එය 1962 වන විට අඩු වී ඇත්තේ සියයට 38·9 තෙක් පමණකි. මි.ර.ගැ. මිල අනුව ගණන් බැලීමේ දී මෙන් නොව, වෙළෙඳ මිල අනුව බැලීමේ දී පෞද්ගලික පාරිභෝජනයට අඩංගු වන ආනයන වටිනාකම මඳ වශයෙන් පහළ වැටීම පුදුමයට කරුණක් ලෙස ගිණිය හැක්කේ නොවේ. මෙයට හේතුව වී ඇත්තේ පිටරටින් ගෙන්වන පාරිභෝගික භාණ්ඩ සඳහා වැඩිවෙමින් පවත්නා තීරු බදුය. රජයේ පාරිභෝජනයට ගැනෙන ආනයන ප්‍රමාණය, 1960 සිටම අඩුවෙමින් පවතී. එහෙත් අවසාන අවුරුද්දේ එය 1959 දීට වඩා වැඩි විය. දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයට අඩංගු වන ආනයන ස්ථාවර ගතියක් දක්නට ලැබුන ද, එය එහි නියම ලක්ෂණයක් විය නොහැකිය. එය දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය ඇස්තමේන්තු සැකැසීමේ දී, යොද ගත් සංකල්පනයන් නිසා පිළිබිඹු වන්නක් විය හැකිය. මුළු ප්‍රාග්ධන සම්පාදනයේ විශාල කොටසක් සකස් වී ඇත්තේ අවක්‍ර ක්‍රම අනුවය. මේ අනුව ප්‍රාග්ධන සම්පාදනයේ වටිනාකම මි.ර.ගැ. මිල ආනයන වටිනාකම හා සැබැඳේ.

**දළ දේශීය නිෂ්පාදිතයේ කාර්මික සැකසුම**

දළ දේශීය නිෂ්පාදිතයේ කාර්මික සැකසුම පවත්නා සාධක වියදම් මිල අනුව වර්ග කොට II අ–11 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

මේ සංඛ්‍යා සටහන අනුව, 1962 දී නිපැයුම් වටිනාකම, බොහෝ සෙයින් ම වැඩි වී ඇත්තේ නිෂ්පාදන අංශයේ බව හෙළි වෙයි. (ගොඩනැගිලි උපකරණ හැර) නිෂ්පාදන වේගය වැඩියෙන් සටහන් වී ඇති අනෙක් අංශ නම්, ''පතල් හා ගල් කැණීම'' 'ප්‍රවාහණ', 'ගබඩා කිරීම හා පණිවුඩ හුවමාරුව', 'රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂාව' 'බැංකු කටයුතු රක්ෂණ හා අනෙකුත් මූල්‍ය' අංශවලය. වර්ෂය තුළ, වී සහ මාලු නිෂ්පාදිතය වැඩි වුවද, 'කෘෂිකාර්මික', 'දව ඇ වන ද්‍රව්‍ය', 'පශු සම්පත' සහ 'ධීවර කර්මාන්තයෙහි' 1962 දී ඇති වූ වර්ධනය සියයට 2·1 ක් පමණෙකි. මෙයට හේතු වී ඇත්තේ මේ අංශයේ අපනයන සඳහා කැරුන නිෂ්පාදන වේගය අඩුවීම නිසා මුළු වර්ධන වේගයම පහළ වැටීමය.

සංඛ්‍යා සටහන II අ—11

## (දළ) දේශීය නිෂ්පාදිතයේ කාර්මික සැකසුම - පවත්නා සාධක වියදම් මිළ අනුව

| කර්මාන්ත | 1959 | | 1960 | | 1961 | | 1962 | | වෙනසේ සියයට ගණන | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. දශ ලක්ෂ | සියයට ගණන | රු. දශ ලක්ෂ | සියයට ගණන | රු. දශ ලක්ෂ | සියයට ගණන | රු. දශ ලක්ෂ | සියයට ගණන | 1959 න් 1960 ට | 1960 න් 1961 ට | 1961 න් 1962 ට |
| i. කෘෂිකර්මය දුව ඇ වන ද්‍රව්‍ය පශු සම්පත හා ධීවර කර්මාන්තය (1) .. .. .. .. | 2,771 | 47·2 | 2,877 | 47·4 | 2,858 | 46·8 | 2,916 | 45·9 | + 3·8 | — 0·7 | + 2·1 |
| ii. පතල් හා ගල් කැණීම .. .. .. | 11 | 0·2 | 11 | 0·2 | 11 | 0·2 | 12 | 0·2 | — | — | +10·3 |
| iii. නිෂ්පාදනය (ගොඩනැගිලි උපකරණ අත්හැර) .. | 267 | 4·5 | 315 | 5·2 | 351 | 5·7 | 417 | 6·6 | +18·0 | +11·4 | +18·7 |
| iv. ගොඩනැංවීම් (ගොඩනැංවීම් උපකරණ ඇතුළත්ව) | 392 | 6·7 | 354 | 5·8 | 352 | 5·7 | 367 | 5·8 | — 9·5 | — 0·8 | + 4·4 |
| v. ප්‍රවාහණය, ගබඩාකිරීම සහ සන්නිවේදන හුවමාරුව .. | 451 | 7·7 | 474 | 7·8 | 469 | 7·7 | 505 | 7·9 | + 5·1 | — 1·0 | + 7·6 |
| vi. තොග සහ සිල්ලර වෙළෙඳාම .. .. | 637 | 10·8 | 646 | 10·7 | 615 | 10·1 | 641 | 10·1 | + 1·5 | — 4·8 | + 4·2 |
| vii. බැංකු, රක්ෂණ හා අනෙකුත් මූල්‍ය .. .. | 48 | 0·8 | 52 | 0·9 | 56 | 0·9 | 59 | 0·9 | + 8·6 | + 7·7 | + 5·7 |
| viii. නිවාස අයිතිය .. .. .. .. | 169 | 2·9 | 178 | 2·9 | 196 | 3·2 | 205 | 3·2 | + 5·9 | + 9·9 | + 4·5 |
| ix. රාජ්‍ය පාලනය හා ආරක්ෂාව .. .. | 386 | 6·6 | 372 | 6·1 | 400 | 6·6 | 428 | 6·7 | — 3·8 | + 7·8 | + 6·8 |
| x. සේවා, අන්තැනෙක නොසඳහන් .. .. | | | | | | | | | | | |
| (අ) රජයේ, වෛද්‍ය, සෞඛ්‍ය, අධ්‍යාපන, ගුවන් විදුලි සහ ආකාශ වස්තු පිරික්සුම් සේවා .. | 315 | 5·4 | 353 | 5·8 | 356 | 5·8 | 348 | 5·5 | +12·0 | + 1·0 | — 2·3 |
| (ආ) අනෙකුත් සියලු සේවා.. .. .. | 426 | 7·3 | 432 | 7·1 | 443 | 7·3 | 458 | 7·2 | + 1·3 | + 2·7 | + 3·4 |
| එකතුව .. .. .. | 741 | 12·6 | 784 | 12·9 | 799 | 13·1 | 806 | 12·7 | + 5·9 | + 1·9 | + 0·9 |
| **දේශීය නිෂ්පාදනය-දළ .. .. ..** | **5,872** | **100·0** | **6,064** | **100·0** | **6,107** | **100·0** | **6,356** | **100·0** | **+ 3·3** | **+ 0·7** | **+ 4·1** |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(1) කෘෂිකාර්මික අපනයන පිළියෙළ කිරීමද ඇතුළත් වෙයි.

නිෂ්පාදනය, අංශ අනුව බැලීමේ දී 1960 සිට කෘෂිකාර්මික අංශයේ නිෂ්පාදනය මදක් අඩුවී තිබීම සැලකිය යුතුය. 1960 දී මේ අංශයේ නිපැයුම, දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 47·4 ක් විය. 1962 දී මෙය සියයට 45·9 තෙක් අඩු විය. එහෙත් කාර්මික නිෂ්පාදන අංශයේ නිපැයුම මදක් වැඩි වී ඇත. 1960 දී සියයට 5·2 ක් වූ මේ අංශයේ නිපැයුම 1962 දී සියයට 6·6ක් තෙක් වැඩි විය. කෘෂිකාර්මික හා කාර්මික අංශවල ඇති වූ මේ මද වෙනස් වීම හැර, අනෙකුත් අංශ 1959 සිට 1962 දක්වා වූ කාලය තුළ නොවෙනස්ව ස්ථාවරව පැවැති යැයි කිව හැකිය.

## මූර්ත නිෂ්පාදිතය, මූර්ත ආදායම හා මූර්ත වියදම

දළ ජාතික නිෂ්පාදිතයේ තාවකාලික ඇස්තමේන්තු 1959 යේ ස්ථාවර සාධක වියදම් මිල අනුව සකසා II අ–12 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත. මේ සංඛ්‍යා සටහනට අඩංගු ශීර්ෂ, සවිස්තර පදනමක් උඩ අවධමනය කොට ඇත්තේ, අපනයන සඳහා කැරුන නිෂ්පාදිත, අන් තැනෙක නොසඳහන් රජයේ, නිෂ්පාදන, වල සහ දේශීය පාරිභෝජනය සඳහා නිපැයුන, වී, තේ සහ පොල් නිෂ්පාදිත සම්බන්ධයෙන් පමණෙකි. වඩා සතුටු දයක මිල දර්ශකයන් නොමැති නිසා, දේශීය පාරිභෝජනය සඳහා නිපැයුන අනෙක් හැම භාණ්ඩයක් හා සේවාවක් ම කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ උප ගණ අනුව ඒකාබද්ධව අවධමනය කොට ඇත.

### සංඛ්‍යා සටහන II අ—12

### ජාතික නිෂ්පාදිතය - දළ - 1959 සාධක වියදම් මිල අනුව

| | 1959 පැවැති වටිනාකම රුපියල් දශ ලක්ෂ | | | | වෙනසේ සියයට ගණන | | |
|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1959න් 1960 ට | 1960න් 1961 ට | 1961න් 1962 ට |
| **1. අපනයන සඳහා නිෂ්පාදනය** | | | | | | | |
| (i) දේශීය අපනයන නැ.වි.ස. වටිනාකම | 1,692 | 1,778 | 1,862 | 1,995 | + 5·1 | + 4·7 | + 7·2 |
| තොග වෙනස්වීමේ වටිනාකම .. | ... | —34 | + 18 | — 41 | | | |
| පාවිච්චි කළ ආනයන භාණ්ඩ හැර (වෙළෙඳ මිල අනුව) .. .. | —121 | —119 | —130 | —145 | | | |
| අපනයන භාණ්ඩ බෙද හැරීමේ වියදම හැර .. .. .. .. | —104 | —108 | —110 | —118 | | | |
| නිපැයුම–ශුද්ධ .. .. .. | 1,467 | 1,517 | 1,639 | 1,692 | + 3·4 | + 8·1 | + 3·2 |
| (ii) ප්‍රති අපනයන : එකතු කළ වටිනාකම | 3 | 2 | 2 | 2 | —20·0 | — | — |
| **අපනයන සඳහා කැරුන මුළු නිෂ්පාදනය: නිපැයුම ශුද්ධ .. ..** | **1,470** | **1,519** | **1,642** | **1,694** | + 3·3 | + 8·1 | + 3·2 |
| **2. දේශීය පාවිච්චිය සඳහා කැරුන නිෂ්පාදනය නිපැයුම - ශුද්ධ -** | | | | | | | |
| (i) වී, තේ සහ පොල් නිෂ්පාදිත .. | 641 | 722 | 731 | 795 | +12·6 | + 1·2 | + 8·8 |
| (ii) රජයේ–අන්තැනෙක නොසඳහන් .. | 701 | 724 | 757 | 776 | + 3·3 | + 4·5 | + 2·5 |
| (iii) අනෙකුත් භාණ්ඩ හා සේවා .. | 3,060 | 3,124 | 3,114 | 3,234 | + 2·1 | — 0·3 | + 3·9 |
| **එකතුව .. .. .. ..** | **4,402** | **4,571** | **4,601** | **4,805** | + 3·8 | + 0·7 | + 4·4 |
| **3. දේශීය නිෂ්පාදනය - දළ - .. ..** | **5,872** | **6,089** | **6,242** | **6,498** | + 3·7 | + 2·5 | + 4·1 |
| **4. පිටරටින් ලැබුන සාධක ආදායම - ශුද්ධ** | **— 37** | **— 44** | **— 40** | **— 46** | | | |
| **5. ජාතික නිෂ්පාදිතය - දළ - .. ..** | **5,835** | **6,045** | **6,202** | **6,452** | + 3·6 | + 2·6 | + 4·0 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

මේ සංඛ්‍යා සටහනට අනුව, දේශීය අපනයනයෙහි මූර්ත වටිනාකම, පසුගිය අවුරුදු දෙකේදීට වඩා, 1962 දී සියයට 7·2 කින් වැඩි වී ඇති බව පෙනේ. එහෙත් මේ වැඩි වර්ධනය ලැබී ඇත්තේ එක් අතකින් තොග අඩු කර ගැනීමෙන් නිසා, අපනයනය සඳහා කැරුණ නිෂ්පාදනයේ නියම අගය 1962 දී වැඩි වී ඇත්තේ සියයට 3·2 කින් පමණකි. එහෙත් 1961 දී අපනයනය සඳහා කැරුන නිෂ්පාදිතයේ නියම වැඩිවීම සියයට 8·1 ක් වී තිබිණි. දේශීය පාරිභෝජනය සම්බන්ධයෙන් වූ නිෂ්පාදිත සම්බන්ධයෙන්, වී තේ සහ පොල් නිෂ්පාදිත සඳහා, ඉතා හොඳ වර්ෂයක් විය. මුදලින්, බලන කල 1962 එහි මුළු වැඩිවීම සියයට 5·8 ක් විය. මූර්ත වශයෙන් එය සියයට 8·8ක් වුවද,* පසුගිය වසරේ වැඩිවීම සියයට 1·2ක් විය. දේශීය ප්‍රයෝජනයට ගත් අනෙකුත් භාණ්ඩ හා සේවා (සංඛ්‍යා සටහනේ ශීර්ෂ II (iii)) ඉහත සඳහන් පදනම අනුව, අවධමනය කිරීමෙන් පසු, නිපැයුම 1962 සියයට 3·9 කින් වැඩි වී පැවැති අතර, 1961 දී වැඩි වී ඇත්තේ සියයට 0·3 කින් පමණෙකි.

සංඛ්‍යා සටහනින් පෙනෙන පරිදි, 1962 දී දළ ජාතික නිෂ්පාදනය, මූර්ත වශයෙන් වැඩි වී ඇත්තේ සියයට 4·0 කිනි. මෙය පසුගිය දෙවස තුළ, ඇති වූ වර්ධනයට වඩා වැඩි දියුණුවකි. 1960 වර්ධනය සියයට 3·6 ක් වූ අතර 1961 වර්ධනය සියයට 2·6 ක් විය. ප්‍රතිශීර්ෂ වශයෙන් බලන විට, මූර්ත නිෂ්පාදනයෙහි දියුණුව, සියයට 1·3 ක් වී ඇත. 1960 දී දියුණුව, සියයට 0·8 ක් වූ අතර, 1961 දී එය සියයට 0·2 කින් පහළ වැටිණි.

සංඛ්‍යා සටහන II අ—13

## මූර්ත ජාතික ආදයම සහ වියදම

| | රුපියල් දශ ලක්ෂ | | | | වෙනසේ සියයට ගණන | | |
|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1959 න් 1960 ට | 1960න් 1961 ට | 1961න් 1962 ට |
| **1. ජාතික නිෂ්පාදිතය-දළ-1959 ස්ථාවර සාධක වියදම් මිල අනුව** | **5,835** | **6,045** | **6,202** | **6,452** | **+3·6** | **+2·6** | **+4·0** |
| 2. පහත සඳහන් අපනයන නිසා වෙළෙඳ අනුපාතයේ බලපෑම | | | | | | | |
| (i) තේ | — | — 26 | — 38 | + 2 | | | |
| (ii) රබර් | — | + 39 | — 25 | — 13 | | | |
| (iii) පොල් නිෂ්පාදිත | — | — 33 | —111 | — 96 | | | |
| (iv) අනෙකුත් නිෂ්පාදිත | — | + 6 | + 1 | + 5 | | | |
| (v) සියලුම නිෂ්පාදිත | — | — 14 | —173 | —102 | | | |
| **3. ජාතික ආදයම–දළ–1959 ස්ථාවර සාධක වියදම් මිල අනුව** | **5,835** | **6,031** | **6,030** | **6,351** | +3·4 | ... | +5·3 |
| 4. ආධාර හැර, අනියම් බදු (ශලපා) | 389 | 402 | 402 | 423 | | | |
| **5. ජාතික වියදම–දළ–1959 ස්ථාවර වෙළෙඳ මිල අනුව** | **6,224** | **6,433** | **6,432** | **6,774** | +3·4 | ... | +5·3 |

සංඛ්‍යා — ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

*වර්ධනය මූර්ක වශයෙන් වැඩිවී ඇත්තේ, මේ භාණ්ඩ සඳහා වූ නිෂ්පාදනය මිල 1961 දී ට වඩා 1962 දී අඩු වීමය. උදහරණයට, 1961 දී වී බුසලක් නිපදවීම සඳහා ගිය (සමස්ථ ලංකා) වියදම්, සාමාන්‍යය රු. 11·53ක් වූ අතර 1962 දී රු. 10·59 ක් වී ඇත. එසේම පොල් ගෙඩියක් නිපදවීම සඳහා 1961 දී ගිය (සමස්ථ ලංකා) වියදම් සාමාන්‍යය සත 14·86 ක් වූ අතර 1962 දී එය සත 12·85 ක් වී ඇත.

II අ–12 වැනි සංඛ්‍යා සටහනේ, 1959 ස්ථාවර මිල අනුව, වූ දළ ජාතික නිෂ්පාදිත ඇස්ත මේන්තු වලින් සකසා ගනු ලැබූ යේ 1959 මිල අනුව වූ, ජාතික ආදයම හා දළ ජාතික වියදම II අ–13 වැනි සංඛ්‍යා සටහනේ දක්වේ. 1959 මිල අනුව වූ දළ ජාතික ආදයම, 1960 සිට 1962 දක්වා වූ ඒ ඒ වර්ෂවල 1959 මිලට වූ දළ ජාතික නිෂ්පාදිතයට අඩු බව පෙනී යයි. මෙයට හේතු වී ඇත්තේ, 1959 වසර හා සසඳනා විට අනෙක් අවුරුදු වල දී විදේශීය වෙළෙඳ අනුපාතය අසතුටුදයක වීමය. එහෙත් 1961 හා සසඳන විට 1962 දී විදේශීය වෙළෙඳ අනුපාතය දියුණු වී ඇත. මෙහි ප්‍රතිඵලය විසින් මූර්ත ජාතික නිෂ්පාදිතය වැඩිවූයේ සියයට 4·0 කින් වුවද, 1962 දී මූර්ත ජාතික ආදයම සියයට 5·3 කින් 1961 දීට වඩා වැඩි විය. 1962 දී මූර්ත ජාතික වියදම ද සියයට 5·3 කින් වැඩි වී ඇත. ප්‍රත්‍ය වශයෙන් සලකන විට, සාධක මිල වෙළෙඳ මිලට ඇගයීමේ පදනමෙහි ඇති වන වෙනස හැර මූර්ත ජාතික වියදම මූර්ත ජාතික ආදයමෙන් වෙන් කර දැකිය හැක්කේ නොවේ.

## නිෂ්පාදනය හා අපනයනය

පිටරට පැටවූ භාණ්ඩ වල නැ.වි.ස. වටිනාකම 1959 පවත්නා මිල අනුව හා ස්ථාවර මිල අනුව ගලපා IIඅ–14 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත. මේ අනුව, 1962 වර්ෂය මෙරට අපනයන වලට වාසිසහගත වර්ෂයක් ලෙස පෙනීයයි. තේ වලට අඩු මිලක් ලැබුනද, පිටරට පැට වූ තේ වල වටිනාකම සියයට 3·1 කින් වැඩිවී ඇත. 1959 ස්ථාවර මිල අනුව වටිනාකමෙහි වැඩිවීම සියයට 6·0 කි. 1961 දී සැලකිය යුතු ලෙස පහළ වැටුන රබර් අපනයන වටිනාකම 1962 දී තරමක් යථා තත්ත්වයට පැමිණියද, 1960 පැවැති උසස් මට්ටමට ලඟා නොවීය. 1962 දී වූ මේ වැඩිවීම, පවත්නා මිල අනුව පසුගිය වසර වලදීට වඩා සියයට 11 ක් වූ අතර, 1959 ස්ථාවර මිල අනුව සියයට 13 ක් පමණ විය. පොල් නිෂ්පාදිත වැඩි වෙමින් තුබුණ නිසා 1962 මේ මාර්ග යෙන් ලද විදේශීය විනිමය, 1961 දීට වඩා රුපියල් කෝටි 2·7 කින් වැඩිවිය.

ප්‍රධාන අපනයන භාණ්ඩ සහ වී නිෂ්පාදනය සම්බන්ධ විස්තර පහත දක්වේ.

### තේ

1962 දී තේ වගාවී තුබූ මුළු බිම් ප්‍රමාණය අක්කර, 5,92,118 ක් පමණ විය. සංශොධිත ඇස්තමේන්තු අනුව, 1961 දී මෙය අක්කර 5,87,401 ක් විය. ඇස්තමේන්තු කළ මුළු තේ නිෂ්පා දනය 1962 දී රාත්තල් කෝටි 46·7 ක් වූ අතර, (II අ–15 සංඛ්‍යා සටහන බලන්න) 1961 දී රාත්තල් කෝටි 45·5 ක් විය. වසර තුළ තේ නිෂ්පාදනයෙහි වැඩිවීම සුළු වුවද (රාත්තල් කෝටි 1·2) පිටරට පැටවූ ප්‍රමාණය රාත්තල් කෝටි 2·6 කින් වැඩි වී ඇත. නිපදවූ ප්‍රමාණයට වඩා පිටරට පැටවූ ප්‍රමාණය වැඩි වූයේ තොග අඩුවීම නිසාය.

පසුගිය දෙවසෙහි රාත්තල් කෝටි 2·0 කින් හා රාත්තල් කෝටි 2·2 කින් වැඩි වූ තේ නිෂ් පාදනය හා සසඳන විට 1962 දී තේ නිෂ්පාදනය රාත්තල් කෝටි 1·2 කින් වැඩිවීම සුළු වැඩි වීමක් බව පෙනේ. 1962 වර්ධන වේගය සියයට 2·6 ක් වී ඇති අතර, පසුගිය දසකයේ වර්ධන වේගය, සියයට 3·8 ක් ව තිබිණි.

1962 දී තේ අක්කරයක සාමාන්‍ය අස්වැන්න ප්‍රමාණය රාත්තල් 789 ක් විය. මෙය 1961 පැවැති, රාත්තල් 775 සහ 1960 පැවැති රාත්තල් 748 හා සැසැඳේ. තේ පැල නැවත වගා කිරීමේ වැඩ පිළිවෙළෙහි වර්ධන වේගය සුළු වුවද, අස්වැන්න ප්‍රමාණය දිගටම වැඩි වෙමින් පැවැතිණි. මෙයට හේතුවූයේ වැඩි වැඩියෙන් පොහොර යෙදීම විය. 1962 දී නැවත පැල සිට වූ අක්කර ගණන 1,769 ක් විය. මෙය 1961 සිට වූ අක්කර 1,298 වඩා මදක් වැඩිය. අලුතෙන් වගා කැරුන සහ නැවත වගා කැරුන තේ අක්කර ප්‍රමාණය 1961 දී 4,028 ක් වූ අතර, 1962 දී අක්කර 4,211 තෙක් වැඩිවිය.

සංඛ්‍යා සටහන II අ—14

## අපනයන වටිනාකම—නැ.වි.ස.

| | පවත්නා මිල | | | | | | | 1959 ස්ථාවර මිල | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 රු. දශ ලක්ෂ | 1960 රු. දශ ලක්ෂ | 1961 රු. දශ ලක්ෂ | 1962 රු. දශ ලක්ෂ | වෙනසේ සියයට ගණන: 1959 න් 1960 ට | වෙනසේ සියයට ගණන: 1960 න් 1961 ට | වෙනසේ සියයට ගණන: 1961 න් 1962 ට | 1959 රු. දශ ලක්ෂ | 1960 රු. දශ ලක්ෂ | 1961 රු. දශ ලක්ෂ | 1962 රු. දශ ලක්ෂ | වෙනසේ සියයට ගණන: 1959 න් 1960 ට | වෙනසේ සියයට ගණන: 1960 න් 1961 ට | වෙනසේ සියයට ගණන: 1961 න් 1962 ට |
| **දෙශීය අපනයන** | | | | | | | | | | | | | | |
| තේ .. .. .. | 1,045 | 1,096 | 1,114 | 1,148 | + 4·9 | + 1·7 | + 3·1 | 1,045 | 1,115 | 1,158 | 1,228 | + 6·7 | + 3·9 | + 6·0 |
| රබර් .. .. .. | 298 | 378 | 260 | 290 | +27·1 | —31·3 | +11·5 | 298 | 337 | 286 | 324 | +13·3 | —15·2 | +13·3 |
| පොල් සහ පොල් නිෂ්පාදිත .. .. | 285 | 238 | 247 | 274 | —16·5 | + 2·7 | +10·9 | 285 | 270 | 359 | 389 | — 5·6 | +33·2 | + 8·4 |
| අනෙකුත් .. .. .. | 64 | 62 | 59 | 54 | — 3·5 | — 5·1 | —8·5 | 64 | 56 | 59 | 53 | —11·7 | + 4·4 | —10·2 |
| **එකතුව** .. .. .. | **1,692** | **1,775** | **1,681** | **1,766** | **+ 4·9** | **— 5·3** | **+5·1** | **1,692** | **1,778** | **1,862** | **1,995** | **+ 5·1** | **+ 4·7** | **+ 7·1** |
| **ප්‍රති අපනයන-එකතුව** .. .. | **62** | **57** | **52** | **42** | **— 7·9** | **— 7·9** | **—19·2** | **62** | **63** | **57** | **49** | **+ 1·6** | **— 9·5** | **—14·0** |

සංඛ්‍යා—ලංකා රේගු වාර්තා සහ ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

### රබර්

1962 අවසාන වන විට තාවකාලික ඇස්තමේන්තු අනුව අක්කර 6,69,129ක රබර් වගාකොට තිබිණි. 1961 පැවැති රබර් අක්කර ගණන 6,69,013ක් විය. 1962දී ආධාර ක්‍රමය යටතේ රබර් නැවත වගා කැරුන අක්කර ගණන, 17,959 ක් වූ අතර, සංශෝධිත සංඛ්‍යා අනුව පසුගිය වසරේ අක්කර ගණන 18,698 ක් විය. මේ අනුව, ආධාර ක්‍රමය ඇරැඹූ 1953 සිට මෙතෙක් නැවත වගා කැරුන අක්කර ප්‍රමාණය 1,93,266 ක් වෙයි. ආධාර ක්‍රමය ඇරැඹීමේදී අක්කර 2,00,000 ක් නැවත වගා කිරීමට ඉලක්ක කැරුනද, නියත වශයෙන් වගාවී ඇති ප්‍රමාණය මේ ඉලක්කයට වඩා අක්කර 6,700 කින් අඩුය.

1962 දී රබර් නිෂ්පාදනය, රාත්තල් කෝටි 22·9 ක් වූයේ 1958න් පසු වාර්තාවී ඇති වැඩිම මට්ටමට පැමිණියේය. මෙය පසුගිය වසරට වඩා රාත්තල් කෝටි 1·4 කින් හෙවත් සියයට 7 කින් පමණ වැඩිය. මේ වැඩිවීමට එක් අතකින් හේතුවූයේ නැවත වගාකළ හා අලුතෙන් වගාකළ රබර් කිරිකපන වයසට එළඹීමෙන් අස්වැන්න වැඩි වීමය. අස්වැන්න මෙසේ වැඩි වූයේ සැප්තැම්බර් ඔක්තෝබර් මාසවල නොකඩවා පැවැති වැස්ස කිරි කැපීමට බාධා කරමින් තිබියදීත්ය.

1962 දී පිටරට පැටවූ රබර් ප්‍රමාණය රාත්තල් කෝටි 22·4 ක් විය. 1961 දී මෙය රාත්තල් කෝටි 19·7 ක් වූ අතර, 1960 දී රාත්තල් කෝටි 23·5 ක් විය. 1962 දී රබර් වලට ලැබුන මිල සාමාන්‍යය, 1961 දීට වඩා අඩු වුවද, පිටරට පැටවූ ප්‍රමාණය වැඩිවීම නිසා ලැබුන ආදයම පසුගිය වසරට වඩා රුපියල් කෝටි 3·0 කින් වැඩිවිය.

සංඛ්‍යා සටහන II අ—15

**ප්‍රධාන කෘෂි බෝග වලින් නිපද වූ ප්‍රමාණයන්**

| බෝ ග ය | 1959 | 1960 | 1961 | 1962 | වෙනසේ සියයට ගණන | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | 1959න් 1960 ට | 1960න් 1961 ට | 1961න් 1962 ට |
| තේ —රාත්තල් දශ ලක්ෂ .. .. .. | 413 | 435 | 455 | 467 | + 5·3 | + 4·6 | + 2·6 |
| රබර් —රාත්තල් දශ ලක්ෂ .. .. .. | 205 | 218 | 215 | 229 | + 6·3 | — 1·4 | + 6·5 |
| පොල් නිෂ්පාදිත*—ගෙඩි දශ ලක්ෂ .. .. | 2,313 | 2,183 | 2,601 | 2,811 | — 5·6 | +19·1 | + 8·1 |
| වී —බුසල් දශ ලක්ෂ .. .. .. | 36·5 | 43·1 | 43·2 | 48·1 | +17·8 | + 0·5 | +11·1 |

සංඛ්‍යා—තේ පාලකගේ පාලන වාර්තාව
රබර් පාලකගේ පාලන වාර්තාව
සංඛ්‍යා හා ජනලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව.

*කොප්පරා, කපාපු පොල්, පොල්තෙල්, සහ ගෙඩිපොල්

### පොල්

1962 පොල් පළදාව ගෙඩි—කෝටි 281·1 කැයි ඇස්තමේන්තු කොට ඇත. 1961 මෙය ගෙඩි කෝටි 260·1 ක් විය. මේ ඇස්තමේන්තුවට මෙරට ප්‍රයෝජනයට ගනු ලබන ප්‍රමාණය (ගෙඩි කෝටි 128·0 කැයි ඇස්තමේන්තු කොට ඇති) සහ පිටරට පැටවූ ප්‍රමාණය (ගෙඩි කෝටි 153.1 කැයි ඇස්තමේන්තුකොට ඇත) ඇතුළත් වෙයි.

1962 දී පොල් පලදාව ගෙඩි කෝටි 21·0 කින් වැඩි වී ඇතැයි ඇස්තමේන්තු කොට ඇත. පසුගිය වසරේ ඇස්තමේන්තු කළ වැඩිවීම ගෙඩි කෝටි 41·8 කි. පසුගිය වසරේ දී මෙන්ම පලදාව වැඩි වීමට හේතුවී ඇත්තේ, වැඩියෙන් පොහොර යෙදීම සහ යහපත් කාල ගුණයයි.

1962 දී පිටරට පැටවූ ප්‍රධාන පොල් නිෂ්පාදිත තුන (ගෙඩි ගණනින්) (පොල්තෙල්, කපාපු පොල්, සහ කොප්පරා) ගෙඩි කෝටි 135·5 සිට ගෙඩි කෝටි 153·0 තෙක් වැඩි වී ඇත. ලැබුන ආදයම ද රුපියල් කෝටි 22·7 වූයේ 1961 දීට වඩා සියයට 12 කින් වැඩි විය.

## වී

තාවකාලික ඇස්තමේන්තු අනුව, 1962 වී නිෂ්පාදනය දළ වශයෙන් බුසල් කෝටි 4·81 කැයි දැක්වේ. මෙය පසුගිය වසරට වඩා බුසල් කෝටි 0·49 කින් වැඩිය. 1961/62 මාස් කන්නයේ අස්වැන්න බුසල් කෝටි 3·03 කි. 1960/61 මාස් කන්නයේ අස්වැන්න බුසල් කෝටි 2·71 ක් විය. 1962 යල් කන්නයේ වී අස්වැන්න බුසල් කෝටි 1·78 ක් වූ අතර, 1961 දී එය බුසල් කෝටි 1·61 ක් විය. 1961/62 මාස් කන්නයේදී බුසලකින් වී බුසල් 38·0 ක් ලැබිණ. මෙය 1960/61 ලැබුණ ප්‍රමාණය වන බුසල් 35·9 හා සසඳන විට, සැලෙනු දියුණුවකි. යල් කන්නයේ දී බුසලකින් බුසල් 37·7 ක් ලැබී ඇත. මෙයද 1961 ලැබුණ ප්‍රමාණය වන බුසල් 36·5 වඩා වැඩිය.

සහතික මිල ක්‍රමය යටතේ 1962 ගත් වී ප්‍රමාණය බුසල් කෝටි 2·53 ක් විය. 1961 දී මෙසේ ගත් ප්‍රමාණය බුසල් කෝටි 2·28 ක්ව තිබිණි. වී නිෂ්පාදනය සහල් ප්‍රමාණයෙන් මණින කළ 1962 දී සහල් ටොන් 6,24,900 සංශොධිත ඇස්තමේන්තු අනුව 1961 දී මෙය සහල් ටොන් 5,61,600 ක්ව තිබිණි. 1962 දී මෙරට පාවිච්චියට ගනු ලැබූ සහල් ප්‍රමාණය ටොන් 11,03,300 කැයි ඇස්තමේන්තු කොට ඇති අතර පිට රටින් ගෙන්වූ ප්‍රමාණය ටොන් 4,04,173 ක් වෙයි.

# ජාතික නිෂ්පාදිතය හා වියදම් විග්‍රහව[1]

මහ බැංකුවේ වාර්ෂික වාර්තාවල පළවෙන සංඛ්‍යා තොරතුරු පූර්ණත්වයෙන් හා නිරවද්‍යතාවයෙන් වැඩි දියුණු කිරීමේ ප්‍රතිපත්තිය අනුව, ජාතික නිෂ්පාදිත හා වියදම් ඇස්තමේන්තු තවදුරටත් ප්‍රතිශෝධනය කොට ඇත. එහෙත් මේ ඇස්තමේන්තු පදනම් වී ඇති, මූලික සංඛ්‍යා තොරතුරු වල නිරවද්‍ය තාවයයෙහි හා සංඛ්‍යා ලබා ගැනීම් ක්ෂෙත්‍රවල, තවමත් අඩු ලුහුඩුකම් ඇති නිසා මේ ඇස්තමේන්තු වල ද, අඩු ලුහුඩු නැත්තේ නොවේ. කෙසේ වුවද, බලාපොරොත්තු වන පරිදි මූලික සංඛ්‍යා තොරතුරු වල අඩු ලුහුඩු කම් මකා ගැනීමට, පියවර ගනු ලැබුව හොත්, ජාතික නිෂ්පාදිත ඇස්තමේන්තු වල විශාල දියුණුවක් ඇතිකර ගැනීමට, හැකි වනවා ඇත.

## පවත්නා මිල අනුව ජාතික නිෂ්පාදිතය හා වියදම් ඇස්තමේන්තු,

පවත්නා මිල අනුව ජාතික නිෂ්පාදිතය හා වියදම් ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කිරීමට එක් අතකින් හේතු වූයේ, ඇස්තමේන්තු සකසන සැලැස්මේ හා ක්‍රමයෙහි ඇති වූ වෙනස්කම්ය. අනෙක් අතට නිරවද්‍යතාවය හා සංඛ්‍යා ක්ෂෙත්‍ර සම්බන්ධව, ශීර්ෂ සවිස්තරව ඇස්තමේන්තු කිරීමේ දියුණුවයි.

(අ) සැලැස්මෙහි හා ක්‍රමයෙහි ඇතිවූ වෙනස්කම් මෙසේය:—

1. දළ ජාතික නිෂ්පාදිතය පිළිබඳ මූලික සංඛ්‍යා සටහනෙහි (II අ—2 සංඛ්‍යා සටහන) අපනයන භාණ්ඩ බෙද හැරීමේ වියදම්, අපනයන නිෂ්පාදිත වටිනාකමෙන් අඩුකොට 'වෙළෙඳාම' හා ''ප්‍රවාහණ හා පණිවුඩ හුවමාරුව'' අතරේ බෙද දක්වා ඇත. කලින් වර්ෂ වලදී මෙම වියදම් (ශුද්ධ) අපනයන නිපැයුමේ කොටසක් වශයෙන් දක්විණි.

2. අර්ථ ක්‍රමයේ ඒ ඒ අංශයෙහි (ශුද්ධ) නිපැයුම ගණන් බැලීමේදී නිෂ්පාදකයාට වන වටිනාකමෙන්, ආනයන උපකරණ වල වටිනාකම අඩු කරනුයේ, වෙළෙඳ වටිනාකම් අනුව සකසාය. කලින් මෙය අඩු කැරුනේ ආනයන වටිනාකම මි.ර.ගැ. මිල අනුව සකසාය. ආනයන උපකරණවල, වෙළෙඳ වටිනා කමට, එම උපකරණ සඳහා අයකැරෙන ආනයන බදු හා උපකරණ බෙද හැරීමේ ඇස්තමේන්තු වියදමද ඇතුළත් වෙයි. මේ බෙද හැරීමේ වියදම් දැනට එකතුකොට, 'වෙළෙඳාම' සහ 'ප්‍රවාහණ හා පණිවුඩ හුවමාරුව'යටතේ බෙද වෙන්කරනු ලැබේ. අනෙක් අතට ආනයන උපකරණවල ආනයන බදු මුළු (ශුද්ධ) නිපැයුම් තක්සේරුවෙන් ඉවත් කොට ඇත. මෙසේ ලබා ගන්නා දළ ජාතික නිෂ්පාදිත ඇස්තමේන්තු, නිෂ්පාදන සාධකයන්ගේ මුළු ඵලය දැනගැනීමේ සත්‍ය මිණුමක් ලෙස ප්‍රත්‍ය වශයෙන් සැලකේ. මෙහි දක්වෙන මුළු එකතු සාධක ඵල ක්‍රමය අනුව සැකසුනද, සම්ප්‍රදයානු කූලව, පවත්නා සාධක වියදම් මිල අනුව වූ, එකතු වශයෙන් හඳුන්වනු ලැබේ.

3. 'රජය' යන්නට, අර්ථ නිරූපනය කිරීමේදී, රජය විසින් අරඹා ඇති, හුදෙක් ව්‍යාපාරි වූ කටයුතු ඉන් වෙන්කොට ඇත. දුම්රිය, විදුලිය, වරාය කොමිසම, තැපැල් හා විදුලි පණිවුඩ හා ලුණු දෙපාර්තමේන්තු, 'රජයෙන්' වෙන්කොට 'රජයේ ව්‍යාපාර' වශයෙන් වර්ගකොට ඇත. රජයේ සමායතන, දෙපාර්ත මේන්තු යටතේ ඇති ව්‍යාපාර වලින් වෙන් කොට, පෞද්ගලික අංශය සමග ''පෞද්ගලික අංශය හා රජයේ සමායතන'' යන බද්ධ ශීර්ෂය යටතේ දක්වා ඇත.[2]

4. මෙම වර්ෂයේදී, ප්‍රථම වරට, බැංකු, රක්ෂණ සමාගම් හා අනෙකුත් මූල්‍ය ආයතනවල ශුද්ධ නිපැයුම පිළිබඳ අවක්‍ර, ඇස්තමේන්තුවක් සකසා ඇත. පුද්ගලයිනට කර ඇති මූල්‍ය සේවා පිළිබිඹු වන පරිදි මෙම ආයතන වල ශුද්ධ නිපැයුමේ කොටසක්, II අ—2 වැනි පාද සටහනේ ''සේවා—අන්තැනෙක නොසඳහන්'' ශීර්ෂය යටතේ දක්වා ඇත. ව්‍යාපාර වෙනුවෙන් කැරුන මූල්‍ය සේවා, අර්ථ ක්‍රමයේ ඒ ඒ අංශවල මුළු (ශුද්ධ) නිපැයුමෙන් කොටසක් වන නිසා වෙනම එකතු කොට නොමැත. කෙසේ වුවද, කාර්මික සැකසුම අනුව දළ දේශීය නිෂ්පාදිතය දක්වෙන II අ—11 වැනි සංඛ්‍යා සටහනෙහි බැංකුවල, රක්ෂණ සමාගම්වල, හා අනෙකුත් මූල්‍ය ආයතන වල මුළු ශුද්ධ නිපැයුම වෙනම ශීර්ෂයක් යටතේ දක්වා ඇති අතර සංඛ්‍යා සටහනෙහි අනෙකුත් ශීර්ෂ වලින් ඒ සුදුසු සේ අඩු කොට ඇත. මූල්‍ය ආයතන වල ශුද්ධ නිපැයුම ගණන් බැලීමේදී, වෙළෙඳ බැංකු වලින් විශිෂ්ට සංඛ්‍යා තොරතුරු ලැබුණ අතර, අනෙකුත් ණය දෙන ආයතන වලින් සතුටුදයක විස්තර ද මහ බැංකුවට ලැබී ඇත. එහෙත් රක්ෂණ සමාගම් වලින් ලැබුණ සංඛ්‍යා තොරතුරු ප්‍රමාණවත් නොවීය. මෙසේ වුවද, මුළු වශයෙන් සලකන විට, ඇස්තමේන්තු සැලකිය යුතු තරම් විශ්වාසදයි බව පෙනේ

5. පසුගිය වර්ෂයේ වාර්ෂික වාර්තාවේ දළ ජාතික නිෂ්පාදිතය සංඛ්‍යා සටහනෙහි ''ප්‍රවාහණය'' ශීර්ෂය හා දළ ජාතික වියදම් සංඛ්‍යා සටහනෙහි ''මෙරට සංචාර'' ශීර්ෂය වෙනුවට මේ වර එම සටහන් වල යොද ඇත්තේ ''ප්‍රවාහණ හා පණිවුඩ හුවමාරුව'' යන්නය. මෙම අළුත් ශීර්ෂයට තැපැල් හා විදුලි පණිවුඩ සේවා හා ආනයන භාණ්ඩ බෙද හැරීමේ, වියදම් යටතේ වෙනත් තැනක ඇතුළත් නොවන වරාය කොමිෂමේ සේවාවන් ද ඇතුළත් වෙයි.

---

1. මහබැංකුවේ 1961 වාර්ෂික වාර්තාවේ ජාතික නිෂ්පාදිතය හා වියදම විග්‍රහවට පරිපූරක වශයෙනි.
2. එක්සත් ජාතීන්ගේ ක්‍රමය අනුව, පෞද්ගලික අංශය හා රජයේ සමායතන එකට සැලකුවද, ලංකාවේ හැටියට මේ දෙ අංශය වෙන වෙනම ගත්තේ නම්, මැනැවැයි හැඟේ. රජයේ සමායතන වලින් මුළු නිපැයුමට හා ප්‍රාග්ධන සම්පාදනයට, වී ඇති සේවාව මැණීම සඳහා පෞද්ගලික අංශය හා රජයේ සමායතනවල (අනියම් ක්‍රමයට) එකාබද්ධ ඇස්තමේන්තුවලින්, සමායතන සංඛ්‍යා වෙන් කිරීම, සඳහා සමායතන වලින් වෙනම සංඛ්‍යා එකතු කිරීමට උත්සාහයක් දරා ඇත. එහෙත්, සංඛ්‍යා එවීමට දක්වන අඩු උනන්දුව නිසා තක්සේරුවට ගන්නා උත්සාහය සඵල වී නැත.

(ආ) සවිස්තර ශීර්ෂ සම්බන්ධයෙන්, සංඛ්‍යාවල නිරවද්‍යතාවය හා සංඛ්‍යා ලබාගත් ක්ෂෙත්‍ර වල ඇති කළ දියුණුව නිසා වූ, ප්‍රධාන ප්‍රතිශෝධන මෙසේය:—

1. II අ—3 හා II අ—7 යන සංඛ්‍යා සටහන් වල දක්වෙන "පෞද්ගලික අංශයේ හා රජයේ සමායතන වල" ප්‍රාග්ධන සම්පාදන ඇස්තමේන්තු වල ප්‍රධාන වෙනසෙක් වෙයි. 1962 වර්ෂයේ සිට "ගොඩනැගිලි හා වෙනත් ගොඩ නැංවීම් කර්මාන්ත" ශීර්ෂය (II අ—7 සංඛ්‍යා සටහන) ඇස්තමේන්තු කැරුනේ ගොඩ නැගිලි භාණ්ඩ වල පවත්නා මි.ර.ගැ. මිලට වූ ආනයන වටිනාකමට, සාධක මිලක් (10/3 ට සමාන) යෙදීමෙනි. මෙයින් සලකා ඇත්තේ "ගොඩනැගිලි හා වෙනත් ගොඩනැංවීම් කර්මාන්ත" ප්‍රාග්ධන සම්පාදනයෙහි වටිනාකම හා ගොඩනැගිලි භාණ්ඩ වල මි.ර.ගැ. ආනයන වටිනාකම අතර සද සම් බන්ධයක් ඇති බවය. 1952 වර්ෂයට පසු ආසන්න වර්ෂවලදී මෙම උප කල්පනයෙහි යම්කිසි සත්‍යයක් තිබුණේ වුවද, මෑත වර්ෂ වලදී සිදුවූ වෙනස්වීම් නිසා, මෙය බොහෝ දුරටම තාත්වික‍ත්වයෙන් තොරය. ප්‍රාග්ධන සම්පාදන වටිනාකමෙහි අනුපාතයක් වශයෙන්, යෙදෙන ආනයන කැරෙන ගොඩනැගිලි භාණ්ඩ (මි.ර.ගැ. මිලට) ප්‍රමාණය, 1952 හා ආසන්න කාලයේදීට වඩා ඉතා අඩුයැයි සැලකීමට කරුණු ඇත. මෙයට එක් හේතුවක් වූයේ අවශ්‍ය සිමෙන්ති මෙරටම නිපදවීමය. අළුත් ඇස්තමේන්තුවල මෙම කරුණ සැලකිල්ලට ගෙන ඇත. ඒවායේ "ගොඩනැගිලි හා වෙනත් ගොඩනැංවීම් කර්මාන්ත වල" ප්‍රාග්ධන සම්පාදන ඇස්තමේන්තු සැකසීම සඳහා 10/3 සාධකය එකතු කිරීමට කලින් සිමෙන්ති කම්හලෙන් පිටවන, විට වූ මිල ගොඩනැගිලි භාණ්ඩ වල ආනයන (මි.ර.ගැ.) මිලට එකතු කොට ඇත. මෙවැනි සංශෝධනයක් කිරීමෙන් පසුද ප්‍රාග්ධන සම්පාදන ඇස්තමේන්තු බොහෝ සෙයින් අනුමාන සහිතවෙයි. ප්‍රාග්ධන සම්පාදන ඇස්තමේන්තු සැකැසෙන ක්‍රම සම්පූර්ණයෙන් වෙනස් කිරීම ඉතා ඉක්මනින්ම කළ යුතු අවශ්‍යතාවයකි. එහෙත් ඒ සඳහා ලංකාවේ පෞද්ගලික ආයෝජන පිළිබඳව ක්‍රමානුකූල සමීක්ෂණයක් කැරෙන තුරු සිටිය යුතුය.

2. ආනයන හා ආනයන බදු දැඩි ලෙස වර්ග කිරීමෙන් පසුව දළ ජාතික නිෂ්පාදිතය හා දළ ජාතික වියදම යන සංඛ්‍යා සටහන් වල අවිනිශ්චිත තැන් සමහරෙක් සකස් කොට ගලපා ඇත. සියලුම සිල්ලර ආනයන (අ) පෞද්ගලික පාරිභෝජනය (ආ) රජයේ පාරිභෝජනය හා (ඇ) දේශීය ප්‍රාග්ධන සම්පාදනය, සඳහා ගෙන්වූ නිම වූ භාණ්ඩ වශයෙන් හෝ අර්ථ ක්‍රමයේ විවිධ අංශයන්හි ප්‍රයෝජනය සඳහා ගෙන්වූ අන්තර් භාණ්ඩ වශයෙන් හෝ වෙන් කැරිණි. මුළු ආනයන බදු ප්‍රමාණය මේ අයුරුම බෙදා දක්වා ඇත. ආනයන හා ආනයන බදු මේ අන්දමට දැඩිලෙස වර්ග කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් රජය විසින් මිලට ගනු ලබන මෙරට භාණ්ඩ හා සේවා (II අ—3 සංඛ්‍යා සටහනෙහි පෞද්ගලික පාරිභෝජන තක්සේරුවේදී මෙය ඉතා සුළු කොට සැලකිණි). ඇස්තමේන්තු වඩා සාර්ථක විය. රජය විසින් මිලට ගන්නා මෙරට භාණ්ඩ හා සේවාවන් දැනට ඇස්තමේන්තු කරනුයේ, එක් අතකින් රජයේ මුළු පාරිභෝජනයද, අනෙක් අතින් රජයේ මුළු ශුද්ධ නිෂ්පාදනය ද සසඳා එහි වෙනසින් ආනයන භාණ්ඩ හා සේවා වලින් රජය මිලට ගත් කොටස අඩු කිරීමෙනි. රජය මෙරටින් මිලට ගැනීමේ මෙම ක්‍රමයට ඇස්තමේන්තු කිරීම නිසා මෙතෙක් රජයේ පාරිභෝජනය හා පෞද්ගලික පාරිභෝජනය ද්විත්ව ව ගුණනය වීම එක්තරා ප්‍රමාණයකට අඩු වන්නට ඇතැයි විශ්වාස කරනු ලැබේ.

3. රජයේ හා "පෞද්ගලික අංශයේ සහ රජයේ සමායතන" අතර ශුද්ධ නිපැයුම ද්විත්ව ගුණනයට හේතුවන කරුණු සමහරක් ඉවත් කිරීමෙන් ප්‍රාග්ධන සංවර්ධන ඇස්තමේන්තු නිරවද්‍යතාවයෙන් දියුණු කොට ඇත. කලින් භාණ්ඩ හා සේවා වියදම යටතේ වැරදීමෙකින් ඇතුළත් කොට තුබූ පැවරුම් ශීර්ෂ සමහරක් හැඳින ඒවා ඉවත් කිරීමෙන් ද රජයේ පාරිභෝජන ඇස්තමේන්තු තවදුරටත් නිදෙස් කොට ඇත.

## මූර්ත නිෂ්පාදිතය, ආදයම් හා වියදම් ඇස්තමේන්තු

නිෂ්පාදිතය හා වියදම වෙන වෙනම ගුණනයේදී ඊට අඩංගුවන ශීර්ෂයන් සවිස්තරව අවධමනය කිරීමේ තැනක් මේ වසරේදී දරා නොමැත. මෙරට පාවිච්චියට ගන්නා භාණ්ඩ හා සේවා නිපැයුමෙහි සැකසීමේදී අවධමනකයන් වශයෙන් මෙතෙක් උපයෝගී කොට ගත් කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ සමහර ශීර්ෂ වලින් මිල වෙනස් වීමෙහි නියම ස්වරූපය පිළිබිඹු නොකරන බව පෙනී ගොස් ඇත. මෙකී දර්ශකයෙහි "ප්‍රවාහණ" ශීර්ෂය (මෙයින් බොහෝ දුරටම පිළිබිඹු වනුයේ ආධාර ක්‍රම යටතේ මගීන් ගෙන යෑම සඳහා අය කරන ගාස්තුය) භාණ්ඩ ප්‍රවාහණ වියදම් සඳහා අවධමනකයක් ලෙස ගැනීමට සුදුසු නොවේ. වියදම් සැකැසීමේදී, පෞද්ගලික පාරිභෝජනය සඳහා ආනයනය කැරුන භාණ්ඩ, සවිස්තරව අවධමනය කිරීමට හා ආනයන ප්‍රාග්ධන භාණ්ඩ වල (අවක්‍ර) මි.ර.ගැ. මිල පදනම අනුව, සැකසෙන පෞද්ගලික ප්‍රාග්ධන සම්පාදනයට ගැනෙන ශීර්ෂ අවධමනය කිරීමට මෙතෙක් පාවිච්චි කළ ආනයන මිල දර්ශකයන්, ආනයන සැලැස්මෙහි ඇතිවූ වර්තමාන වෙනස්කම් නිසා බොහෝ දුරට නොගැලපෙන ස්වභාවයක් ගෙන ඇත.

තාත්වික අවධමනකයන් සැකසීමේ ප්‍රශ්නය සැලකිල්ලට භාජනව පවතී. මේ ප්‍රශ්නය නිරාකරණය වන තෙක් මූර්ත නිෂ්පාදිතය, ආදයම හා වියදම සැකසීම, සඳහා මේ වාර්ෂික වාර්තාවේ ඉතා ආසන්න ක්‍රමයක් යොදා ගෙන ඇත. මෙහි දක්වා තිබෙන මූර්ත ජාතික නිෂ්පාදිතය ඇස්තමේන්තු කිරීමේදී, අපනයනය සඳහා කැරුන නිෂ්පාදිතයන්, මෙරට පාරිභෝජනය සඳහා කැරන වී, තේ, සහ පොල් නිෂ්පාදිතයන්, ගෙන නියම වශයෙන් නිපද වූ ප්‍රමාණය පදනම් කොට, 1959 ස්ථාවර මිල අනුව අගය කොට ඇත. රජයේ ශුද්ධ නිපැයුම අවධමනය කොට ඇත්තේ, රජයේ සේවකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකයන් (මෙය 1959—62) කාලය තුළදී නොවෙනස්ව තුබූ බව පෙනී ගොස් ඇත). උපයෝගී කොට ගෙනය. නිපැයුම් ඉතිරි කොටස කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි දේශීය ගණ උප දර්ශකයෙන් අවධමනය කොට ඇත. මෙය, ඇතුළත් විවිධ ශීර්ෂයන්ගේ ස්ථාවර මිල වටිනාකම්හි එකතුව වෙනුවට යොදන ලද ඉතා රළු වූත්, දළ වූත්, ආදේශකයකි. මෙම ක්‍රමයෙහි වැරදි අතර පළමුව මෙහි උපගණයෙන් නිෂ්පාදකයාට වූ මිලට වඩා සිල්ලර මිල වෙනස් වීම පිළිබිඹු වෙයි. දෙවැනිව, මෙම උප දර්ශකයේ ශීර්ෂබර තැබීම් ජාතික නිෂ්පාදිත සටහනෙහි ශීර්ෂ බර තැබීම් වලට වඩා වෙනස් වෙයි. මෙසේ වුවද, මෙය දැනට තිබෙන අනෙකුත් මිල දර්ශකයනට වඩා මිල වෙනස්වීම් පිළිබඳ තාත්වික ස්වරූපයක් පිළිබිඹු කරයි.

II අ — 13 සංඛ්‍යා සටහනෙහි මූර්ත ජාතික ආදයම් ඇස්තමේන්තු සකසා ඇත්තේ (ඉහත විස්තර කළ පරිදි) ලබාගත් ජාත්‍යන්තර වෙළෙඳ අනුපාතය වෙනස් වීමෙන්, මූර්ත ආදයම කෙරෙහි ඇතිවූ බලපෑම් සැකසූ මූර්ත ජාතික නිෂ්පාදිත ඇස්තමේන්තු අනුවය. මූර්ත වියදම් ඇස්තමේන්තු සකසා ඇත්තේ, මූර්ත ආදයම් ඇස්තමේන්තු වලට, ආධාර අඩුකොට අවක්‍ර බදු එකතු කිරීමෙනි. (1959 පාද වර්ෂයේදී මූර්ත වියදමට වූ ආධාර අනුපාතය 1960 සිට 1962 තෙක් වූ වර්ෂ වලදීද එසේම තිබෙන සේ ආධාර ප්‍රමාණය ගණන් ගැණිනි).

මේ වාර්තාවෙහි දක්වා ඇති, මූර්ත නිෂ්පාදිතය, ආදයම හා වියදම පිළිබඳ ඇස්තමේන්තු ආසන්නවූත්, තාවකාලික වූත්, ඇස්තමේන්තු බව කිව යුතුය. සමහර විට නියම වශයෙන් ඇතිවූ වර්ධනයට වැඩියෙන් මෙහි දක්වෙනවා විය හැකිය. මෙසේ වැඩියෙන් ඇස්තමේන්තු වීමක් සිදුවී ඇත්නම් එසේ වී ඇත්තේ, දේශීය නිෂ්පාදිතයෙන් වැඩි කොටසක්, කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ දේශීය උපගණයට අනුව අවධමනය කොට තිබීම නිසාය. මෙයින් සමහර විට, දේශීය භාණ්ඩ හා සේවා සඳහා, නිෂ්පාදකයාට වැටෙන මිල අඩුවෙන් සටහන් විය හැකිය.